**ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම - 2023**

**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ ("සමාගම") සහ එහි පරිපාලිත සමාගම්වල ("සමූහය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරි සමාගමක සහාය මා විසින් ලබා ගන්නා ලදී.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**අවධාරණය කරනු ලබන කරුණ**

සමාගම

සමාගමේ පරිපාලිතවල ආයෝජන ඉවත් කිරීම සහ සමාගමේ ජීවිත හා ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාර වෙන් කිරීම.

2023 මාර්තු 17 දිනැති ලිපියට අනුව, තෝරාගත් පරිපාලිතවල ආයෝජන ඉවත් කිරීම සහ සමාගමේ ජීවිත හා ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාර වෙන් කිරීම පිළිබඳව මූල්‍ය ප්‍රකාශන සඳහා වූ අංක 46.2 සහ 46.3 සටහන්වලින් විස්තර කෙරේ. 2023 මාර්තු 14 දිනැති අංක 23/0431/604/046 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ ආයෝජන ඉවත් කිරීමට අදාළ වූ රජයේ ප්‍රතිපත්තිය මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් සන්නිවේදනය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත උපදෙස් මත පදනම්ව ක්‍රියාමාර්ග ආරම්භ කරන ලදී. එබැවින්, ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන්

පීඑල්සී, කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම, ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම, ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්) සමාගම යන සමාගම්වල පවතින සමාගමේ කොටස් හිමිකාරීත්වය සහ ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම විසින් කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගමේ පවත්වාගෙන යන කොටස් වහාම ක්‍රියාත්මක වන පරිදි මහා භාණ්ඩාගාරයට පැවරීමට සහ 2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ විධිවිධානවලට සම්පූර්ණයෙන්ම අනුකූල වන පරිදි, සමාගමේ ජීවිත සහ ජීවිත නොවන රක්‍ෂණ ව්‍යාපාර වෙනම නෛතික ආයතන යටතේ ස්ථාපනය කිරීම සිදු කරනු ලදී. ඒ අනුව, 2023 දෙසැම්බර් 05 දිනැති අංක MP/LA/022/CM/2023/305 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් අනුමත කරන ලද ආකෘතියට අනුව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ ජීවිත හා ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාර පූර්ණ හිමිකාරීත්වය සහිත පරිපාලිත ආයතන දෙක වෙත පැවරීම සිදු විය. 2023 දෙසැම්බර් 22 වැනි දින, දිසා අධිකරණයේ නඩුවක් ගොනු කරන ලද අතර 2024 ජනවාරි 02 දින වෙන් කිරීම සඳහා අධිකරණ නියෝගයක් ලබා ගන්නා ලදී. පසුව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම විසින් 2007 අංක 7 දරන සමාගම් පනතේ 256 වගන්තිය ප්‍රකාරව කොළඹ වාණිජ මහාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරන ලද අතර 2024 ජනවාරි 19 දින සමථ පරික්‍රමය සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. 2024 ජනවාරි 16 දින කැඳවන ලද විශේෂ මහා සභා රැස්වීමකදී වෙන් කිරීම මගින් ඇති වූ ප්‍රධාන ගනුදෙනුව කොටස් හිමියන් විසින් ද අනුමත කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් 2024 පෙබරවාරි 01 වන දින සිට බලාත්මක වූ රක්ෂණ බලපත්‍ර අනුපිළිවෙළින් සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත ලබා දෙන ලද අතර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ බලපත්‍රය අවසන් කරන ලදී. තවද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් 2024 පෙබරවාරි 22 දිනැති අංක IRCSL/DG/LEG/2024/02/060 දරන ලිපිය මගින්, 2024 අගෝස්තු 20 වැනි දින හෝ ඊට පෙර සමාගමේ නමෙන් ("ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම") "රක්ෂණ" යන පදය ඉවත් කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමට දින දීර්ඝ කිරීමක් ලබා දෙන ලදී. වාර්තා කරන කාල පරිච්ඡේදය වන විට, ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී, කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම, ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම, ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්) සමාගමේ යෝජිත කොටස් පැවරීමේ කටයුතු තවදුරටත් සිදු වෙමින් පැවතුණි.

**සමූහය**

**කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම සහ එහි පරිපාලිතයන්හි අඛණ්ඩ පැවැත්මට අදාළ ප්‍රමාණවත් අවිනිශ්චිතතාවය.**

කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම සහ එහි පරිපාලිත සමාගම් වන හෙලංකෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්) සමාගම සහ සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්) සමාගම ඇතුළත් වන සමූහයට අදාළව අඛණ්ඩව පැවැත්ම සඳහා පවතින හැකියාව පිළිබඳව අධ්‍යක්ෂවරුන් විසින් තක්සේරුවක් කර ඇති බව විස්තර කෙරෙන මූල්‍ය ප්‍රකාශන සඳහා වූ 48.2 සටහනට අනුව, සමූහයට දූරදැකිය හැකි අනාගතයක් සඳහා අඛණ්ඩව ව්‍යාපාර කටයුතුවල නියැලී සිටීමට අවශ්‍ය සම්පත් ඇති බවට අධ්‍යක්ෂවරුන් සෑහීමකට පත් වී ඇති බව දැක්වේ. තවද, අඛණ්ඩ පැවැත්ම සඳහා සමූහයට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතා කිසිවක් පිළිබඳව අධ්‍යක්ෂවරු දැනුවත්ව නොසිටිති. එබැවින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම මත පිළියෙළ කරනු ලැබේ. කෙසේ වුවද, හෙලංකෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015 වසරේ හම්බන්තොට දී හෝටලය ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතිය අත්හිටුවීමට තීරණය කර ඇති බව සඳහන් විය. 2020 ජුලි 10 දිනැති 20/1042/204/050 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණ ද, වාර්තාකරණ කාල පරිච්ඡේදය වන විට, සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්) සමාගම විසින් ග්‍රෑන්ඩ් හයට් කලම්බු ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කර නොතිබුණි. 2022 මැයි 30 සිට ක්‍රියාත්මක වන පරිදි, මාස 09ක කාලපරිච්ඡේදයක් සඳහා ග්‍රෑන්ඩ් හයට් කලම්බු ව්‍යාපෘතිය යම් පරිමාණයකින් අඩු කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන

ලද අතර ඉදිකිරීම් කටයුතු වාර්තා කරන දිනය වන විටත් නැවත ආරම්භ කර නොතිබුණි. තවද, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම මගින් පවත්වාගෙන යනු ලබන කොටස් සහ කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගමෙහි පවතින ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම සතු කොටස් මහා භාණ්ඩාගාරය වෙත පැවරීමට 2023 මාර්තු 13 දිනැති අංක MF/018/2023/055 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඉහත සඳහන් ආයෝජන ඉවත් කිරීමේ වැඩසටහන ආරම්භ කර ඇති අතර උනන්දුව ප්‍රකාශ කිරීම් (EOI) කැඳවීමේ ක්‍රියාවලිය මේ වන විට අවසන් කර ඇත.

**ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් නිසි පරිදි සංස්ථාපනය කිරීම.**

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ අංක 46.1 සටහනට අනුව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් 2014 ජූලි 25 සහ 2023 ඔක්තෝබර් 11 යන දිනයන්හිදී 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ විධිමත් ලෙස සංස්ථාපනය කරන ලදී. 2023 මාර්තු 14 දිනැති අංක 23/0431/604/046 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, 2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ රෙගුලාසිවලට අනුකූල වීම සඳහා, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ දීර්ඝකාලීන සහ ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාර වෙන් කිරීම සඳහා සමාගම පිහිටුවන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් 2024 පෙබරවාරි 01 සිට ක්‍රියාත්මක වන පරිදි ව්‍යාපාර කටයුතු කරගෙන යයි.

**මැනේජ්මන්ට් සර්විසස් රක්‍ෂණ (පුද්) සමාගම විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම වෙත ද්විතීයනය කරන ලද සේවකයින් මාරු කිරීම.**

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ අංක 46.4 සහ 48.5 සටහන්වලට අනුව, 2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම වෙන් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමත් සමඟ, මැනේජ්මන්ට් සර්විසස් රක්‍ෂණ (පුද්) සමාගම විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම වෙත ද්විතීයනය කරන ලද සේවකයින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් වෙත සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත මාරු කර ඇත. සේවකයින් මාරු කළ ද, සමාගම තවමත් පවතින අතර, මූල්‍ය ප්‍රකාශන අත්සන් කරන දිනය වන විට ද සමාගම වසා දැමීම පිළිබඳව තීරණයක් ගෙන නොතිබුණි. ඒ අනුව, අඛණ්ඩ පැවැත්ම පිළිබඳ මූලධර්මය පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත;

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව;

- සමාගම සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව; සහ

- සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දශෙය |
| --- | --- | --- |
| 2009 ජූනි 04 වැනි දින ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් තීන්දුවට අනුව, සමාගමේ බහුතර කොටස්වල නීත්‍යානුකූල අයිතිය ශ්‍රී ලංකා රජය වෙනුවෙන් තබා ගැනීමට භාණ්ඩාගාර ලේකම් වෙත පවරා තිබුණි. තවද, එකී තීන්දුවට අනුව, ඩිස්ටිලරීස් ශ්‍රී ලංකා පොදු සමාගම, මෙම සමාගමේ මව් සමාගම ලෙස කටයුතු කළ කාලසීමාව තුළ සමාගම ඉපැයූ ලාභවලින් පෙර මව් සමාගමට ආරෝපණය කල යුුතු ලාභය ගණනය කර පියවිය යුුතු බව භාණ්ඩාගාර ලේකම්වරයාට නියෝග කරන ලදී. කෙසේ වුවද, 2022 මාර්තු 09 දිනැති ඔවුන්ගේ නීති නියෝජන ලිපියේ සඳහන් වන පරිදි, සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ (SLIC) ජනාධිපති නීතිඥවරයාගේ මතය වන්නේ කොළඹ දිසා අධිකරණයේ අංක DMR/02394/19 දරණ නඩුවට අනුව, ඉහත ප්‍රකාශිත ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත්‍රවල (SC FR No 117/2007 and SC/FR No. 158/2007) ක්‍රියාදාමයෙන් භාණ්ඩාගාර ලේකම්වරයාගේ වගකීම ඉටු කිරීමට දිසා අධිකරණයේ ගොනු කළ නඩුවේ පැමිණිලිකරුවන්ට සමාගමෙන් සහනයක් ඉල්ලා සිටිය | පෙර සිටි මව් සමාගමට ආරෝපණය කළ ලාභය ගණනය කර ගෙවන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය මගින් භාණ්ඩාගාර ලේකම්වරයාට නියෝග කරන ලදී. එබැවින්, ලාභය ගණනය කිරීමට සමාගමේ ඍජු මැදිහත්වීමක් නොමැත. | ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව කටයුතු කිරීමට නිර්දේශ කෙරේ. |

නොහැකි බවයි. තවද, 2023 ජනවාරි 18 වැනි දින මුදල් අමාත්‍යාංශය සමඟ කළ සාකච්ඡාවට අනුව, අමාත්‍යාංශයේ අදහස වූයේ වාර්තාවට අනුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ඉහත නඩුවේ පාර්ශවකරුවෙකු නොවන බවයි. එබැවින්, මෙම තත්ත්වය සනාථ කිරීම සඳහා නීතිපතිවරයාගෙන් නීතිමය තහවුරු කිරීමක් ලබා ගැනීමට සමාගම කටයුතු කරමින් සිටියි. කෙසේ වුවද, කොළඹ දිසා අධිකරණය විසින් අංක DMR/02394/19 දරන ඉහත නඩුවේ තීන්දුව වාර්තා කරන කාලය වන විට ප්‍රකාශ කර නොමැති අතර ඉහත සඳහන් කළ නඩුවලින් වගකීම් පියවීමට අදාළ සුදුසු විගණන සාක්ෂි මුදල් අමාත්‍යාංශය සමඟ පැවති සාකච්ඡාවේ දී ලබා ගැනීමට මට නොහැකි විය. තවද, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ ස්ථාවරය සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ එම තහවුරු කිරීම ද වාර්තා කිරීමේ කාලසීමාව තුළදී ලබා ගැනීමට නියමිතව තිබුණි. එබැවින්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ගනු ලැබූ මුල් තීරණය සහ පසුව ඇති වූ සාකච්ඡාව සහ වර්තමාන වර්ධනයන් සැලකිල්ලට ගනිමින්, සමාගම විසින් ඉහත සඳහන් තීරණය මගින් ආරෝපණය කළ හැකි ලාභ සඳහා මූල්‍ය ප්‍රකාශනවල කිසිදු ගැළපීමක් සිදු කර නොතිබුණි.

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

| අයිතමය | මුදල (රු.) | නොසැපයූ සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් පීඑල්සී සමාගමෙන් ලැබිය යුතු මුදල් | රු.140,324,510 | ශේෂ සනාථන | මෙම ශේෂයට ඩිස්ටිලරීස් සමාගම් සමූහයෙන් ලැබිය යුතු ශේෂය ඇතුළත් වේ. 2009 ජූනි 04 දින ලබා දුන් අධිකරණ තීන්දුව අවසානයකට ගෙන ඒමෙන් පසුව මෙම මුදල ගළපනු ලැබේ. | ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කෙරේ. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ණයගැති පෙරගෙවුම් සහ අනෙකුත් ණයගැති ගිණුම්වල එකතුව රු. 7,753,427 ක් වූ වසර හතක දීර්ඝ කාලයක් පුරා හිඟව පවතින ශේෂ නිරීක්ෂණය විය. තවද, ණයගැති ගිණුමේ රු. | <u>ලැබිය යුතු ශේෂය රු. 7,753,427</u><br>මේවා පරිපාලිත සමාගම්වල දීර්ඝකාලීනව පැවති හිඟ ශේෂ වන අතර ලබන වසරේ අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | දීර්ඝකාලීනව පැවති හිඟ ශේෂ නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කරනු ලැබේ.<br><br>මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂවල නිරවද්‍යතාවය සහ පැවැත්ම සහතික කිරීම සඳහා අදාළ ලිඛිත සාක්ෂි සැපයීම |

| | | |
|---|---|---|
| 9,812,801 ක් වූ දිගුකාලීන ගෙවිය යුතු හිඟ ශේෂ පැවතුණි. | සෘණ ශේෂය රු. 9,812,801<br>ඉහත ශේෂ කලින් හිමිකරුගේ සමූහ සමාගම්වලට ගෙවිය යුතු මුදලට අදාළ වේ. අපි නීතිඥවරුන් සමඟ සාකච්ඡා කර සුදුසු පියවර ගන්නෙමු. | අවශ්‍ය වේ. වෙනත් ලැබිය යුතු ගිණුම්වල ඇතුළත් සෘන ශේෂ නිවැරදි කාණ්ඩයට නැවත වර්ගීකරණය කිරීමට ද නිර්දේශ කෙරේ. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් ආපසු ගෙවීමට හෝ කපා හැරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් ඇතැම් ප්‍රතිරක්ෂණ ගෙවිය යුතු ශේෂ දින 730 (වසර දෙකක්) ක කාලයක් ඉක්මවා පැවති බව නිරීක්ෂණය විය. වසර 2 ඉක්ම වූ ප්‍රතිරක්ෂණ ගෙවිය යුතු ශේෂවල වයස් විශ්ලේෂණ පහත දක්වා ඇත.<br><br>**වර්ෂ 2-3**: රු.24,350,469<br>**වර්ෂ 3-4**: රු.12,542,331<br>**වර්ෂ 4-5**: රු.863,655<br>**වර්ෂ 5 කට වැඩි**: රු.2,797,901 | ප්‍රතිරක්ෂණ හිඟ ශේෂ ගෙවීම් සතිපතා අධීක්ෂණය කරමින් පවතින අතර හිඟ ශේෂවල වලංගුභාවය දැනටමත් තක්සේරු කර ඇත. වසර 4කට වැඩි කාලයක් සඳහා හිඟව පවතින මුදල රු. මිලියන 3.5කි. එසේ වුවද, ඉන් ප්‍රධාන කොටස වසර 2-4 කාණ්ඩයට අයත් වේ. එය කොවිඩ් බලපෑමට ලක් වූ කාලපරිච්ඡේදය වූ අතර ඉන් පසුව, බදු ඉන්වොයිසි වෙනස් කිරීමට අවශ්‍ය වූ වැට්/බදු ගැළපුම් කිහිපයක් සිදු කළ යුතු විය. ඇතැම් මුදල් විශේෂයෙන්ම ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) හේතුවෙන් කල් ඉකුත් විය. ලැබිය යුතු මුදල් හිලව් කිරීමට විකල්පයක් ලබා ගැනීම සඳහා අප විසින් ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) සමඟ රැස්වීමක් පවත්වන ලද අතර දැනට ඔවුන්ගේ අනුමැතිය / ප්‍රති යෝජනාව අපේක්ෂාවෙන් සිටිමු. | හිඟ මුදල්වල වලංගුභාවය තක්සේරු කිරීමට සහ දීර්ඝකාලීන හිඟ ශේෂ එකතු වීම වැළැක්වීම සඳහා ගෙවීම් නිරන්තරයෙන් අධීක්ෂණය කිරීමට නිර්දේශ කෙරේ. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති සහ රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අ. | පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 01/2021 (iii) | සියලුම ප්‍රධාන මෙහෙයුම් ආවරණය වන පරිදි අත්පොත්වල පැහැදිලිව නිර්වචනය කළ යුතු පද්ධති, ක්‍රියාවලි සහ ප්‍රොටෝකෝල | කෙටුම්පත් අත්පොත පිළියෙළ කර අධ්‍යක්ෂ මණ්ඩල පරීක්ෂාව සඳහා ඉදිරිපත් කර ඇත. එය 2024 දෙසැම්බර් 31 දිනට පෙර ක්‍රියාත්මක කරනු ඇත. | අවශ්‍ය ක්‍රියා පටිපාටි අත්පොත් පිළියෙළ කිරීම සහ ඒවා අවබෝධ කර ගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රමාණයට කාර්ය |

| | | | | |
|---|---|---|---|---|
| | | ඇති අවස්ථාවල සමාගම විසින් අත්පොත් පවත්වාගෙන යා යුතුය. තවද, චක්‍රලේඛයට අනුව, එවැනි ප්‍රතිපත්ති අත්පොත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කිරීම අවශ්‍ය වේ.<br>කෙසේ වුවද, සමාගම විසින් ආයෝජන අත්පොත ව්‍යුහගත ආකාරයකින් සහ පැහැදිලි ව්‍යුහයක් සහ සූචියක් සහිතව පවත්වාගෙන ගොස් නොතිබුණි. එසේම, අත්පොත කාලානුරූපව සමාලෝචනය කර නිසි ලෙස යාවත්කාලීන කර නොතිබුණු අතර එමෙන්ම, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ද ඒ සඳහා ලබා ගෙන නොතිබුණි. | | මණ්ඩලය පුහුණු කිරීම ද නිර්දේශ කෙරේ.<br><br>ශීඝ්‍රයෙන් ඇති වන මූල්‍ය වෙළඳපොළවල් මෙන්ම ක්ෂණිකව ඇති වන අවස්ථාවන්වලදී ප්‍රතිපත්ති යාවත්කාලීනව පවතින බව සහතික කිරීම සඳහා සමාගමේ අත්පොත කාලීනව සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතුය.<br><br>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අත්පොත අනුමත කළ යුතුය. |
| **ආ.** | ආයතනික පාලන මාර්ගෝපදේශය - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල ඒ.5.5 වගන්තිය යටතේ, "මණ්ඩලය විසින් නිර්ණායක සහ පවතින තොරතුරු මත පදනම්ව, එක් එක් විධායක නොවන අධ්‍යක්ෂවරයාගේ ස්වාධීනත්වය වාර්ෂිකව තීරණය කළ යුතුය." කෙසේ වුවද, සමාගම අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වයට අදාළ තොරතුරු අනාවරණය කර නොමැති බව නිරීක්ෂණය විය. | සමාගම රජය සතු ව්‍යවසායක් (SOE) වීම හේතුවෙන්, රජය සතු ව්‍යවසාය පිළිබඳ මාර්ගෝපදේශවල 2.4 වගන්තියේ දක්වා ඇති හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවලට අනුකූලව සමාගම කටයුතු කරයි. විධායක, විධායක නොවන, හෝ ස්වාධීන අධ්‍යක්ෂ (ID) වශයෙන් එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ධූරයේ තත්ත්වය අනාවරණය කළ යුතු වේ. කෙසේ වුවද, අදහස් දැක්වීම සටහන් කර ගන්නා ලදී. | සමාගමේ පාලනය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආයතනික පාලන මාර්ගෝපදේශයට ස්වේච්ඡාවෙන් අනුකූල වීම නිර්දේශ කෙරේ. |

| | | | | |
|---|---|---|---|---|
| ඇ. | ආයතනික පාලන මාර්ගෝපදේශය - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල ඞී.5.2 වගන්තිය යටතේ, "මණ්ඩලය විසින් පත් කරනු ලබන සභාපතිවරයෙකු සමඟ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු (RPT) සමාලෝචන කමිටුවක් ස්ථාපනය කළ යුතු අතර, සෑම කාර්තුවකම එක් වරක් රැස් විය යුතුය". කෙසේ වුවද, සමාගමට සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුවක් නොමැති බව නිරීක්ෂණය විය. | සම්බන්ධිත පාර්ශව ගනුදෙනු (RPT) කමිටුවක් ස්ථාපනය කිරීම සඳහා පවතින අදහස්/නිර්දේශය සටහන් කර ඇත. දැනට පවතින විගණන සහ අනුකූලතා කමිටුව සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු හඳුනා ගැනීම සඳහා භාවිතා කරන ක්‍රමවේදයේ සඵලතාවය මෙන්ම ඒ ආශ්‍රිත හෙළිදරව් කිරීම්වල විශ්වසනීයත්වය සමාලෝචනය කරයි. එවැනි සෑම පාර්ශ්වයකින්ම සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ වාර්ෂික ප්‍රකාශයක් ලබා ගැනීමේ ක්‍රියා පටිපාටිය ද එම කමිටුව මගින් අධීක්ෂණය කරයි. මීට අමතරව, එය ආයතනයේ වාර්ෂික වාර්තාකරණය සඳහා රජය සතු ව්‍යවසාය (SOE) සඳහා වූ ආයතනික පාලන මාර්ගෝපදේශ මගින් නියම කර ඇති හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සමඟ අනුකූල වීම සහතික කරයි. | සමාගමේ පාලනය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආයතනික පාලන මාර්ගෝපදේශයට ස්වේච්ඡාවෙන් අනුකූල වීම නිර්දේශ කෙරේ. |
| ඇ. | ආයතනික පාලන මාර්ගෝපදේශය - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල ඒ.5 වගන්තිය යටතේ, මණ්ඩලයේ තීරණ ගැනීමේදී, කිසිදු තනි පුද්ගලයෙකු හෝ කුඩා තනි පුද්ගල කණ්ඩායමකට ආධිපත්‍යය දැරීමට හැකියාවක් ඇති නොවන පරිදි, විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ තුලනයක් මණ්ඩලය තුළ පැවතීම වඩාත් සුදුසු වේ. කෙසේ වුවද, විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් පමණක් සමන්විත වන මණ්ඩලය තුළ තුලනය වූ තත්ත්වයක් නොපවතින බව නිරීක්ෂණය විය. | අදහස් දැක්වීම් සටහන් කර ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමට අයත් කොටස්වලින් 99.98%ක් ශ්‍රී ලංකා රජය සතු වේ. ඒ අනුව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය (BOD) පත් කරනු ලබන්නේ භාණ්ඩාගාරයේ ලේකම් විසින් වන අතර, ඔහු ශ්‍රී ලංකා රජය සතු කොටස් හිමිකම අනුව ශ්‍රී ලංකා රජය වෙත ලැබෙන කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ නිසි බලය ලත් නිලධාරියා වේ. අධ්‍යක්ෂ මණ්ඩලය (BOD) පත් කිරීම ද භාණ්ඩාගාර ලේකම් විසින් සිදු කරනු ලබන අතර මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම් විසින් ජනාධිපති සහ අගමැති ලේකම්වරුන් සහ | රක්ෂණ කර්මාන්තයේ උපායමාර්ගික තීරණ ගැනීම, අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ තරගකාරී ස්ථානගත කිරීම් වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට විධායක අධ්‍යක්ෂවරුන් පත් කිරීම සහ රක්ෂණ ක්ෂේත්‍රයේ වෘත්තිකයන් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂඥතාව වැඩි දියුණු කිරීමට නිර්දේශ කෙරේ. |

| | |
|---|---|
| මීට අමතරව, වත්මන් අධ්‍යක්ෂවරුන්ට රක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ දැනුමක් නොමැති බව නිරීක්ෂණය විය. | විගණකාධිපතිවරයා ඇතුළු අදාළ පාර්ශ්ව වෙත පිටපත් මගින් දැනුම් දෙනු ලැබේ.<br><br>ඉහත ව්‍යුහයේ පරාමිතීන් තුළ, අධ්‍යක්ෂ මණ්ඩලය (BOD) පත් කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය (BOD) කටයුතු කිරීම. විශේෂයෙන් සුදුසු සහ නිසි නිර්ණායකවලට අනුකූලව මෙම පත්කිරීම් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් ඇගයීමට ලක් කර තහවුරු කර ඇත. |

## 1.8 මුදල් කළමනාකරණය

**විගණන නිරීක්ෂණය**

බැංකු සැසඳුම් ප්‍රකාශනවල හඳුනා නොගත් බැර වශයෙන් හඳුනා නොගත් ශේෂ දක්වා ඇති අතර ඒවා නිරවුල් කිරීමකින් තොරව වසර 4කට වැඩි කාලයක් පුරා බැංකු සැසඳුම් ප්‍රකාශනවල දක්වා ඇත. ඒ පිළිබඳව විස්තර පහත දක්වා ඇත.

**ජීවිත නොවන රක්ෂණය**

| ස්ථානය | හඳුනා නොගත් හර | හඳුනා නොගත් බැර | හඳුනා නොගත් වෙනත් ශේෂ |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 4,723,813 | 100,967,823 | 808,814 |
| ශාඛාව | 795,987 | 87,314 | - |

**ජීවිත රක්ෂණය**

| ස්ථානය | හඳුනා නොගත් හර | හඳුනා නොගත් බැර | හඳුනා නොගත් වෙනත් ශේෂ |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 52,348 | 29,077,041 | 173,941 |
| ශාඛාව | 496,716 | 3,354 | - |

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**

විගණකගේ අදහස් දැක්වීම සම්බන්ධයෙන් එකඟ වෙමි. කෙසේ වුවද, බැංකු සැසඳුම් ප්‍රකාශවල මෙම හඳුනා නොගත් ශේෂ ඇති වීමට හේතු වූ පහත සඳහන් හේතු අපි හඳුනාගෙන ඇත්තෙමු.

<u>හඳුනා නොගත් බැර</u>
ප්‍රධාන වශයෙන් මෙම ශේෂ ඇති වී ඇත්තේ බැර ගනුදෙනුවල රක්ෂණ ඔප්පු අංක නොමැති වීම හේතුවෙනි. අදාළ සියලුම අභ්‍යන්තර දෙපාර්තමේන්තු සහ බැංකුවල සහාය ඇතිව, නිසි විස්තර නොමැතිව බැර කර ඇති මුදල්වලට අදාළ රක්ෂණ ඔප්පු අංක නිවැරදිව හඳුනා ගැනීම අවශ්‍ය වේ.
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ බැංකු ගිණුම්වලට බැර කිරීමට පෙර ගනුදෙනු වලංගු කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දෙපාර්තමේන්තු සහ බැංකුවල සහාය ඇතිව අප විසින් පද්ධති සංවර්ධන කටයුතු ආරම්භ කර ඇත.

**නිර්දේශය**

හඳුනා නොගත් බැරවල ඇතුළත් අයිතමවල රක්ෂණ ඔප්පුහිමියන් විසින් ඔවුන්ගේ ඔප්පු අංක සඳහන් නොකර සිදු කරන ලද බැංකු පත් ගෙවීම් අඩංගු වන බැවින්, බැංකුව සමඟ ඒකාබද්ධ වී, ඔවුන්ගේ සහාය ලබා ගැනීම මගින් නිසි හඳුනාගැනීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට

අප විසින් මහජන බැංකුව, DFCC සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමඟ මේ සම්බන්ධ සංවර්ධන කටයුතු අවසන් කර ඇත. දැනට පවතින ගැටළු අවම කිරීම සඳහා අභ්‍යන්තර දෙපාර්තමේන්තු සහ බැංකු සමඟ අදාළ ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් සිටින්නෙමු.

<u>හඳුනා නොගත් හර</u>

මෙම ශේෂවල ගනුදෙනුකරුවන්ගේ තැන්පතුවලට අදාළ අසාර්ථක ගනුදෙනු සඳහා බැංකු විසින් කරන ලද ප්‍රතිවර්තන ඇතුළත් කිරීම් හා ප්‍රතිවර්තනය කළ ගෙවීම් ඇතුළත් වේ. රක්ෂණ ගිවිසුම් අවලංගු කිරීම මගින් පාරිභෝගික තැන්පතු ප්‍රතිවර්තනය කිරීම නිවැරදි කරනු ලැබේ. ආපසු ලබා දුන් ගනුදෙනු සඳහා අප විසින් ගෙවීම් කළ පසු, හඳුනා නොගත් ගෙවීම් නිවැරදි කරනු ලැබේ. ඒ වන තුරු, මුදල් හඳුනා නොගත් හර ලෙස දැක්වේ.

<u>වෙනත් හඳුනා නොගත් මුදල් (SLIP ප්‍රතිවර්තන</u>)

මෙයට ප්‍රධාන වශයෙන් ඇතුළත් වන්නේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ මුදල් පොතේ සටහන් කර ඇති සහ බැංකුවෙන් සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන මාර්ගගත SLIP ගෙවීම් ය. මෙය මාසයේ අවසාන දිනයේදී පැන නගින අරමුදල් හුවමාරුවේ තාවකාලික කාල වෙනසක් වන අතර ඊළඟ වැඩ කරන දිනයේදී මෙය නිරවුල් කෙරේ.

නිර්දේශ කෙරේ.

වත්මන් තත්ත්වය සහ අත්පත් කර ගත් ප්‍රගතිය

පසුගිය මාස කිහිපය තුළ අපගේ බැංකු සැසඳුම් ක්‍රියාවලිවලදී සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇත:

සාමාන්‍ය සහ ජීවිත බැංකු සැසඳුම් ප්‍රකාශ ව්‍යාපෘතිය සාර්ථක ලෙස සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම මගින් අපගේ සංවිධානය අත් කර ගත් ජයග්‍රාහී සන්ධිස්ථානයක් නියෝජනය කරයි. අප අපගේ දෛනික බැංකු සැසඳුම් ක්‍රියා පටිපාටි විධිමත් කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉහළ කාර්යක්ෂමතාවයක් සහ නිරවද්‍යතාවයක් ළඟා කර ගැනීමට හැකි වී ඇත.

යෙදුම් ක්‍රමලේඛන අතුරුමුහුණතක් (API) සංවර්ධනය කිරීම තුළින් අපගේ බැංකු මෙහෙයුම් කටයුතු තවදුරටත් නිරවුල් කිරීම සම්බන්ධයෙන් අපගේ අවධානය යොමු වී ඇත. බාධාවකින් තොරව දෛනික බැංකු ක්‍රියා පටිපාටි සිදු කිරීම සහතික කිරීම සඳහා මෙම API යොමු කිරීම් වලංගු කිරීම සහ MT940 ගොනු ලබා ගැනීම සඳහා තීරණාත්මක මෙවලමක් ලෙස ක්‍රියා කරනු ඇත. තවද, මෙම API හරහා සියලුම සෘජු බැංකු හුවමාරු කිරීම් රක්ෂණ ඔප්පු අංක සමඟ සිතියම් ගත කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමට හැකි වනු ඇත.

සම්පූර්ණයෙන් නිම කෙරෙන ඉහත ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් වශයෙන්, හඳුනා නොගත් හර සහ හඳුනා නොගත් බැර හෝ දීර්ඝකාලීන හිඟ ශේෂ පිළිබඳ එවැනි ගැටළු ඉතා ඉක්මනින් සැලකිය යුතු මට්ටමින් අවම කළ හැකි වනු ඇත.

## 1.9 තොරතුරු තාක්ෂණ පොදු පාලන

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **අ.** | 2023 ජූනි 28 වැනි දින නිකුත් කරන ලද සමාගමේ තාර්කික ප්‍රවේශ පාලන ප්‍රතිපත්තිය, මූලික පද්ධති යෙදුම් සඳහා ප්‍රවේශයේ 11.5 වගන්තිය යටතේ "පරිශීලක ප්‍රවේශ කළමනාකරණ ක්‍රියා පටිපාටිය" වෙත යොමු කර ඇත. කෙසේ වුවද, සමාලෝචනය කිරීමෙන් පසුව එවැනි ක්‍රියා පටිපාටියක් නොතිබුණි. | සාකච්ඡා කරන ලද සොයාගැනීම් ISO 27001 හි සඳහන් වේ: 11.0 වගන්තිය යටතේ තාර්කික ප්‍රවේශ පාලන ප්‍රතිපත්තිය. පරිශීලක ප්‍රවේශ කළමනාකරණය.<br>අපි තාර්කික ප්‍රවේශ පාලන ප්‍රතිපත්තියේ 11.5 වගන්තියේ වචන යොදා ඇති අන්දම යාවත්කාලීන කරන්නෙමු. | තාර්කික ප්‍රවේශ පාලන ප්‍රතිපත්තියේ හඳුනාගෙන ඇති පරතරය විසඳීම සඳහා පුළුල් පරිශීලක ප්‍රවේශ කළමනාකරණ ක්‍රියා පටිපාටියක් සංවර්ධනය කිරීම සහ ලේඛනගත කිරීම නිර්දේශ කෙරේ. මෙම ක්‍රියා පටිපාටිය මගින් මූලික පද්ධති යෙදුම් සඳහා පරිශීලක ප්‍රවේශය ලබා දීම, වෙනස් කිරීම සහ අවලංගු කිරීම සඳහා වන ක්‍රියාවලි සහ පාලනයන් ගෙනහැර දැක්විය යුතුය. එය කාර්යභාර සහ වගකීම්, ප්‍රවේශ ඉල්ලීම් කාර්ය ප්‍රවාහ, අනුමත කිරීමේ යාන්ත්‍රණ, පරිශීලක ප්‍රතිපාදන සහ වි-ප්‍රතිපාදන ක්‍රියාවලීන්, කාලානුරූප ප්‍රවේශ සමාලෝචන සහ අවම වරප්‍රසාද මූලධර්ම බලාත්මක කිරීම සඳහා වන ක්‍රියාමාර්ග ද අර්ථ දැක්විය යුතුය. |
| **ආ.** | සේවාදායකයා විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ "11.3 පරිශීලක ගිණුම් කළමනාකරණය" - තාර්කික ප්‍රවේශ පාලන ප්‍රතිපත්තිය, අර්ථ දක්වා ඇති බව සමාලෝචනයේදී සඳහන් විය, උපුටා දැක්වීමට අනුව,<br>"11.3.9 තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව දින 90ක් තිස්සේ ප්‍රවේශ නොවූ පරිශීලක ගිණුම් ස්වයංක්‍රීයව අක්‍රිය කර ඇති බවට සහතික විය යුතුය." කෙසේ වුවද, මූලික රක්ෂණ පද්ධතියේ (Core Insurance System) සියලුම පරිශීලක වාර්තා සමාලෝචනය කිරීමේදී, භාවිත නොකළ, සක්‍රිය පරිශීලක ගිණුම් 40ක් ඇති බව නිරීක්ෂණය විය. | අර්ධවාර්ෂික පරිශීලක ප්‍රවේශ සමාලෝචනයක් පැවැත්වීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම එකඟ විය. | පරිශීලක ගිණුම් කළමනාකරණ ප්‍රතිපත්තියට අනුකූලව, දින 90ක් පුරා ප්‍රවේශ නොවූ පරිශීලක ගිණුම් ස්වයංක්‍රීයව අක්‍රිය කිරීම බලාත්මක කිරීම සඳහා මූලික රක්ෂණ පද්ධතිය (Core Insurance System) තුළ ස්වයංක්‍රීය ගිණුම් කළමනාකරණ ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීම සුදුසු වේ. මෙම ස්වයංක්‍රීයකරණය ප්‍රවේශ පාලන ක්‍රම ස්ථිර ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කරනු ඇති අතර මෙමඟින්, අනවසර පිවිසීමේ අවදානම ද අවම කරයි. |

| | | | |
|---|---|---|---|
| ඇ. | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ වෙනස කළමනාකරණය කිරීමේ ක්‍රියා පටිපාටියේ "4.8. වෙනස සඳහා ඉල්ලීමක් (ව්‍යාපාරික පරිශීලක/පාරිභෝගික) ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතු පියවර සමාගම විසින් අර්ථ දක්වා ඇති බව සඳහන් විය. උපුටා දැක්වීමට අනුව,<br><br>"4.8.3. වෙනස් කිරීමේ ආකෘතිපත්‍ර (ඇමුණුම-බී බලන්න) සඳහා ඉල්ලීම දෘඩ පිටපතක් ලෙස හෝ විද්‍යුත් තැපැලේ ඇමුණුමක් වශයෙන් විද්‍යුත් තැපැලෙන් සන්නිවේදනය කළ හැකිය."<br><br>කෙසේ වුවද, ආකෘතිපත්‍ර සමාලෝචනය කිරීමේදී, පරිශීලක දෙපාර්තමේන්තුව සහ තොරතුරු තාක්ෂණික දෙපාර්තමේන්තුව මගින් ඇතැම් ආකෘතිපත්‍ර සම්පූර්ණ කර නොමැති බවත්, අනුමැති ලබා දී නොමැති බවත් නිරීක්ෂණය විය. | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ සැලසුම් අංශය මගින් කාර්ය ප්‍රවාහ මත පදනම් වූ වෙනස් කිරීම් අනුමත කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරන ලදී. | ඉල්ලීම් ආකෘති පත්‍ර වෙනස් කිරීම සඳහා පුළුල් සමාලෝචනයක් සහ අනුමත කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම, පරිශීලක දෙපාර්තමේන්තු සහ තොරතුරු තාක්ෂණ නිලධාරීන් විසින් සම්පූර්ණ කිරීම සහතික කිරීම සහ සමාගමේ වෙනස් කිරීමේ කළමනාකරණ ක්‍රියා පටිපාටියට අනුකූලව වෙනස් කිරීම් ක්‍රියාත්මක කිරීමට පෙර අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම නිර්දේශ කෙරේ. |
| ඇ. | ව්‍යාපාර විශ්ලේෂණ ඒකකය / (BAU) වෙතින් ප්‍රතිරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ සමූහ ව්‍යාපාර දෙපාර්තමේන්තුවට සම්ප්‍රේෂණය වන තොරතුරු සඳහා ප්‍රතිරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිසි ක්‍රමවේදයක් නොමැති බව නිරීක්ෂණය විය. එබැවින්, සපයන ලද දත්තවල සම්පූර්ණත්වය සහ නිරවද්‍යතාවය සහතික කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයක් නොමැත.<br><br>මීට අමතරව, සමාගම විසින් ඉකුත් වර්ෂයේ විස්තර භාවිතා කරමින්, අවදානම් පැතිකඩ අතින් සකස් කරමින් සිටින බව නිරීක්ෂණය විය. ප්‍රතිරක්ෂණ දෙපාර්තමේන්තුව දෙපාර්තමේන්තු කිහිපයකින් තොරතුරු රැස් කරන අතර, ඔවුන් | <u>ජීවිත ප්‍රතිරක්ෂණ අංශය</u><br>2023/12/31 දිනෙන් අවසන් වන කාල සීමාව සඳහා ප්‍රතිරක්ෂණ ගිණුම් ප්‍රකාශන සඳහා ප්‍රතිරක්ෂණකරු (Munich Re) විසින් සපයන ලද ශේෂ සනාථනවල වෙනසක් නොමැති බව පෙන්වා දීමට කැමැත්තෙමු. තවද, ප්‍රතිරක්ෂණ ගණනය කිරීම් සඳහා අපි ප්‍රාරක්ෂණ සහ හිමිකම් දෙපාර්තමේන්තු විසින් සත්‍යාපනය කරන ලද දත්ත භාවිතා කරමු. එබැවින්, ජීවිත අංශය සඳහා සඳහන් කර ඇති ඇඟවීම සම්බන්ධයෙන් එකඟ වීමට අපට නොහැකිය. | දත්තවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය පරීක්ෂා කිරීම සහ ප්‍රතිරක්ෂණ දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් වඩාත් ඵලදායී වන පරිදි අවදානම් පැතිකඩ නඩත්තු කිරීමේ ක්‍රමය අතින් නඩත්තු කිරීමේ සිට ERP පද්ධතිය මගින් නඩත්තු කිරීම දක්වා වෙනස් කිරීම නිර්දේශ කෙරේ. |

මූලාශ්‍ර දත්තවල නිරවද්‍යතාව සහ සම්පූර්ණත්වය පරීක්ෂා නොකරයි. ප්‍රතිරක්ෂණ දෙපාර්තමේන්තුව වෙනත් දෙපාර්තමේන්තු මගින් සපයන දත්ත මත රඳා පවතී.

කෙසේ වුවද, ගතික වාර්තාකරණය සහ අනෙකුත් ප්‍රතිලාභ ලබා ගත හැකි වන පරිදි ERP පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට සහ ජීවිත ප්‍රතිරක්‍ෂණ වැඩසටහනක් ඇතුළත් කිරීමට අපි එකඟ වෙමු.

<u>ප්‍රතිරක්ෂණ අංශය</u>

i. ගිවිසුම අලුත් කිරීම සඳහා මාස 09ක දත්ත මත පදනම්ව වාර්ෂික අවදානම් පැතිකඩ සංවර්ධනය කරනු ලබන අතර ඉකුත් වර්ෂයේ දත්ත මත පදනම්ව, මීළඟ අලුත් කිරීම සඳහා මාස 12ක් සඳහා සංවර්ධනය කළ යුතුය.

ii ප්‍රතිරක්‍ෂණ දෙපාර්තමේන්තුවේ නිර්මාණය කරන ලද පැතිකඩ, එක් එක් දෙපාර්තමේන්තුවල දත්ත සහ මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ජනනය කරන ලද කාර්තුමය ගිණුම් සමග නිරවද්‍යතාව සැසඳීම.

iii. පසුගිය වසර දහයේ දත්තවලට එදිරිව ආයුගණක කණ්ඩායමේ සහාය ඇතිව වැඩිදුර ප්‍රවණතා විශ්ලේෂණය සිදු කෙරේ. ඉන් අනතුරුව, අදාළ ගිවිසුම් ප්‍රතිරක්ෂණ තැරැව්කරු වෙත පවතින දත්ත සහ අවසාන වශයෙන් ගිවිසුම් ප්‍රතිරක්ෂණකරු වෙත පවතින දත්ත මගින් පරීක්ෂා කරනු ලැබේ. දෝෂයක් සඳහා වන ආන්තිකය ඉතා අවමය.

අවසාන වශයෙන්, පහත සඳහන් කරුණු සටහන් කර ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

| | | | |
|---|---|---|---|
| | | i) අපි පසුගිය වර්ෂ 05 පුරා ප්‍රතිරක්ෂණ පද්ධති සංවර්ධනය සඳහා කටයුතු කරමින් සිටිමු; කෙසේ වුවද, සංවර්ධකයා විසින් තවමත් අප සමඟ කාලසටහන බෙදාගෙන නොමැති බැවින් ක්‍රියාත්මක කිරීමේ දිනය සඳහන් කළ නොහැකිය.<br><br>ii) වත්මන් පැතිකඩ/දත්ත උත්පාදනය අතින් සිදු වන බව අපි පිළිගනිමු. කෙසේ වුවද, එය මුලින් ත්‍රිකෝණ ආධාරයෙන් මනින අතර, ජීවගණක කණ්ඩායම සමඟ ප්‍රවණතාව පරීක්ෂා කරනු ලැබේ.<br><br>අප ප්‍රතිරක්ෂණකරුවන් වෙත ඉදිරිපත් කරන දත්ත, අවම වශයෙන් පසුගිය වසර 10ක් සඳහා අධිලේඛිත දත්ත සමඟ ප්‍රතිරක්ෂණ තැරැව්කරු මෙන්ම ප්‍රතිරක්ෂණකරුවන් විසින් තවදුරටත් ඇගයීමට ලක් කරයි. | |
| ඉ. | විශේෂිත පද්ධතියක් නොමැති වීම හේතුවෙන් සමාගම විසින් Excel හි bordereaux පරිගණක දත්ත ගබඩාව සහ facultative register අතින් නඩත්තු කර ඇති බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ලැයිස්තු සැකසීම හෝ ගිණුම්කරණ පද්ධතියට දත්ත මාරු කිරීම සඳහා ක්‍රමානුකූල ක්‍රියාවලියක් නොතිබුණි. අතින් ප්‍රවේශ වීම හේතුවෙන් දත්ත අඛණ්ඩතාවයට බලපාන අවදානම්, දෝෂ, අකාර්යක්ෂමතා ඇති විය හැකි අතර නිසි පාලනයන් නොමැති විය හැකිය. | මේ සම්බන්ධයෙන් ITC දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දෙන ලද අතර මෙම අවශ්‍යතාවය සම්බන්ධයෙන් කලින් සංවර්ධකයා වූ "Belvantage" සමඟ රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. සංවර්ධකයා විසින් කණ්ඩායම විසින් සංශෝධන යෝජනා කරන ලද සංවර්ධනයේ දළ සටහන පිළිබඳ ඉදිරිපත් කිරීමක් කරන ලදී. අප විසින් අතින් ලබා ගන්නා දත්ත, ගිවිසුම් ප්‍රතිරක්ෂණකරුවන් වෙත අප ඉදිරිපත් කරන කාර්තුමය ගිවිසුම් සංඛ්‍යාලේඛන සහ කාර්තු පදනමින් නියාමක වෙත වෙන වෙනම ඉදිරිපත් කරන දත්ත සමඟ ත්‍රිකෝණගත කර ඇත. එබැවින් දෝෂයක් ඇතිවීමේ අවස්ථාව ඉතා විරල ය. අතින් ක්‍රියා කිරීමේ පද්ධතිය සමාගම ආරම්භයේ සිටම ක්‍රියාත්මක වන අතර වසර 62 කට ආසන්න කාලයක් නිවැරදි දත්ත ලබා දී ඇත. ඒකාබද්ධ පද්ධතියක් සඳහා අඩු කාලයක් ගත වන අතර වැඩි | දත්ත හැසිරවීම විධිමත් කිරීමට, නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීමට සහ පාලන වැඩි දියුණු කිරීමට කැප වූ ප්‍රතිරක්ෂණ කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. බාධාවකින් තොරව දත්ත හුවමාරු කිරීම සඳහා ගිණුම්කරණ පද්ධතිය සමඟ ඒකාබද්ධ කරන බවට සහතික වීම. |

| | | | |
|---|---|---|---|
| | | නිරවද්‍යතාවයකින් ක්‍රියා කරනු ඇතැයි අපි විශ්වාස කරමු, කෙසේ වුවද, දැනට පවතින සංවර්ධන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට කාලය ගත වනු ඇත. | |
| ඊ. | 2023 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල ජී.2 වගන්තිය යටතේ, සිදුවීම් සඳහා ප්‍රතිචාර දැක්වීම, විකිණුම්කරු කළමනාකරණය, ආපදා ප්‍රතිසාධනය, පාලන ව්‍යුහය, ICT විගණන විෂය පථය සහ සයිබර් ආරක්ෂණ රක්ෂණය ඇතුළු ශක්තිමත් සයිබර් ආරක්ෂණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලය විසින් ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියෙකු (CISO) පත් කළ යුතුය. කෙසේ වුවද, සමාගම සඳහා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියක් නොතිබුණි. | අදහස් දැක්වීම් සටහන් කර ගන්නා ලදී. සඳහන් කර ඇති අවශ්‍යතාවය 2023 නොවැම්බර් මාසයේ නිකුත් කරන ලද යාවත්කාලීන කළ මනා පරිච සංග්‍රහය සමඟ අනුකූල වේ. මෙම නව අවශ්‍යතාවයට අනුකූල වීම සහතික කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත. | සයිබර් ආරක්ෂාවට ප්‍රමුඛත්වය ලබා දී මෙම අවදානම් ඵලදායී ලෙස අවම කිරීම සඳහා පුළුල් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ස්ථාපනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

**සමාගම**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 7,779 ක ලාභයක් වූ අතර ඊට අනුකූලව ඉකුත් වර්ෂයේ ලාභය රු. මිලියන 10,546 කි. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 2,767ක හෙවත් සියයට -26.24 ක පිරිහීමක් නිරීක්ෂණය විය. කොන්ත්‍රාත් වගකීම්වල - ජීවිත අරමුදලේ සෘණ වෙනස්කම වැඩි වීම සහ ආදායම් බදු වියදම් වැඩිවීම මෙම අඩුවීම සඳහා හේතු විය.

**සමූහය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 13,755 ක ලාභයක් වූ අතර ඊට අනුකූලව ඉකුත් වර්ෂයේ ලාභය රු. මිලියන 12,584 කි. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 1,171 ක වර්ධනයක් නිරීක්ෂණය විය. එම වර්ධනයට හේතු වන්නේ සමාගමේ ආයෝජන ආදායම ඉහළ යාමය.

**2.2** ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| රේඛීය අයිතමය | 2023 | 2022 | 2021 | 2020 | 2019 |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **සමාගම** | | | | | |
| **ආදායම** | **64,194** | **63,685** | **64,062** | **52,614** | **48,608** |
| විචලනය | 509 | (377) | 11,447 | 4,005 | 4,228 |
| වැඩිවීම / (අඩුවීම) | 0.8% | -0.59% | 21.76% | 8.24% | 9.53% |
| **දළ ලිඛිත වාරිකය** | **44,225** | **41,272** | **43,231** | **39,421** | **33,794** |
| විචලනය | 2,953 | (1,959) | 3,809 | 5,626 | 2,056 |
| වැඩිවීම / (අඩුවීම) | 7.16% | -4.53% | 9.66% | 16.65% | 6.48% |
| **ශුද්ධ හපැයූ වාරිකය** | **36.862** | **37,024** | **38,396** | **34,206** | **29,772** |
| විචලනය | (162) | (1,372) | 4,190 | 4,434 | 1,767 |
| වැඩිවීම / (අඩුවීම) | -0.44% | -3.58% | 12.25% | 14.89% | 6.31% |
| **ආයෝජන ආදායම** | **28,444** | **13,794** | **23,392** | **16,511** | **17,671** |
| විචලනය | 14,649 | (9,599) | 6,881 | (1,160) | 4,612 |
| වැඩිවීම / (අඩුවීම) | 106.21% | -41.03% | 41.68% | -6.57% | 35.32% |
| **ශුද්ධ උපලබ්ධි (අලාභය) / ලාභ** | **(2,588)** | **11,857** | **1,012** | **359** | **(56)** |
| විචලනය | (14,444) | 10,845 | 653,231 | 416, | (2,032) |
| වැඩිවීම / (අඩුවීම) | -121.82% | 1,071.64% | 181.57% | -737.24% | -102.86% |
| **වෙනත් ආදායම්** | **1,418** | **943** | **1,183** | **1,469** | **1,132** |
| විචලනය | 475 | (240) | (285) | 336 | (154) |
| වැඩිවීම / (අඩුවීම) | 50.42% | -20.35% | -19.44% | 29.76% | -12.02% |
| **මුළු ආදායම** | **64,194** | **63,685** | **52,614** | **48,609** | **51,224** |
| විචලනය | 509 | 11,448 | 4,005 | 4,229 | 6,844 |
| වැඩිවීම / (අඩුවීම) | 1% | 21.76% | 8.24% | 9.53% | 15.42% |
| **ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම්** | **(21,778)** | **(22,131)** | **(20,185)** | **(15,772)** | **(16,623)** |
| විචලනය | 353 | (1,946) | (4,413) | 851 | 1,131 |
| වැඩිවීම / (අඩුවීම) | -1.60% | 9.64% | 27.98% | -5.12% | -6.37% |
| **ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත් කර ගැනීමේ පිරිවැය (ප්‍රතිරක්ෂණය ඇතුළුව)** | **(3,502)** | **(3,301)** | **(3,220)** | **(2,996)** | **(2,986)** |
| විචලනය | (199) | (81) | (223) | (10) | (488) |
| වැඩිවීම / (අඩුවීම) | 6.05% | 2.53% | 7.46% | 0.36% | 19.55% |
| **ගිවිසුම්ගත වගකීම් වෙනස්වීම - ජීවිත රක්ෂණ අරමුදල** | **(18,290)** | **(11,018)** | **(18,849)** | **(16,118)** | **(11,659)** |
| විචලනය | (7,272) | (7,831) | (2,730) | (4,458) | (3,505) |
| වැඩිවීම / (අඩුවීම) | 66% | -41.55% | 16.94% | 38.24% | 42.99% |
| **වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම්** | **(9,920)** | **(14,757)** | **(10,081)** | **(9,754)** | **(9,133)** |
| විචලනය | 4,837 | (4,675) | (327) | (621) | (311) |
| වැඩිවීම / (අඩුවීම) | -32.77% | 46.37% | 3.35% | 6.80% | 3.53% |
| **ආදායම් බදු වියදම** | **(2,925)** | **(1,930)** | **(1,684)** | **(2,183)** | **(1,176)** |

| | | | | | |
|---|---|---|---|---|---|
| විචලනය | 994 | 246 | 498 | (1,007) | 729 |
| වැඩිවීම / (අඩුවීම) | 51.54% | 14.61% | -22.85% | 85.64% | -38.29% |
| **වර්ෂයේ ශුද්ධ ලාභය** | **7,779** | **10,546** | **10,041** | **5,788** | **7,028** |
| විචලනය | (2,767) | 505 | 4,252 | (1,240) | 1,784 |
| වැඩිවීම / (අඩුවීම) | -26.24% | 5.03% | 73.47% | -17.65% | 34.02% |
| | | | | | |
| **සමූහය** | | | | | |
| **සමූහයේ වෙනත් මෙහෙයුම්වලින් ලද ලාභය** | **103,215** | **90,621** | **62,143** | **46,505** | **50,685** |
| විචලනය | 12,595 | 28,478 | 15,637 | (4,179) | 4,627 |
| වැඩිවීම / (අඩුවීම) | 14% | 45.83% | 33.62% | -8.25% | 10.05% |
| **ආයෝජන ආදායම** | **14,119** | **15,370** | **24,044** | **17,754** | **16,954** |
| විචලනය | 14,119 | (8,674) | 6,289 | 800 | 2,582 |
| වැඩිවීම / (අඩුවීම) | 91.86% | -36.08% | 35.43% | 4.72% | 17.97% |
| **වෙනත් ආදායම්** | **2,893** | **3,563** | **3,233** | **1,540** | **1,835** |
| විචලනය | -679 | 330 | 1,693 | (294) | (192) |
| වැඩිවීම / (අඩුවීම) | -19% | 10.20% | 109.89% | -16.06% | -9.50% |
| **මුළු ආදායම** | **170,785** | **156,605** | **99,932** | **98,779** | **99,265** |
| විචලනය | 14,180 | 56,673 | 1,153 | (486) | 7,162 |
| වැඩිවීම / (අඩුවීම) | 9.05% | 28.09% | 1.17% | 7.25% | 7.78% |
| **වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම්** | **20,450** | **(26,867)** | **(16,692)** | **(15,417)** | **(20,154)** |
| විචලනය | 6,417 | (10,175) | (1,274) | ( 4,736) | (5,570) |
| වැඩිවීම / (අඩුවීම) | 24% | 60.95% | 8.27% | -23.50% | 38.19% |
| **පරිපාලිත සමාගම්වල සේවා සඳහා වියදම** | **(86,807)** | **(77,123)** | **(63,422)** | **(40,053)** | **(38,992)** |
| විචලනය | (9,683) | (13,701) | (23,368) | (1,061) | (301) |
| වැඩිවීම / (අඩුවීම) | 12.56% | 21.60% | 58.34% | 2.72% | 0.78% |
| **ආදායම් බදු වියදම්** | **(6,203)** | **(3,579)** | **942** | **(2,560)** | **(3,848)** |
| විචලනය | (2,624) | (4,521) | 3,503 | 1,288 | (1,030) |
| වැඩිවීම / (අඩුවීම) | 73.32% | -479.67% | -136.82% | -33.48% | 36.55% |
| **වර්ෂයේ ශුද්ධ ලාභය** | **13,755** | **12,584** | **6,580** | **6,930** | **4,513** |
| විචලනය | 1,171 | 6,003 | (349) | 2,416 | (3,089) |
| වැඩිවීම / (අඩුවීම) | 9.31% | 91.22% | -5.04% | 53.54% | -40.63% |

## 2.3 අනුපාත විශ්ලේෂණය

| **සමාගම සඳහා නිශ්චිත අනුපාත** | **2023** | **2022** | 2021 | 2020 | 2019 |
|---|---|---|---|---|---|
| රඳවා ගැනීමේ අනුපාතය | 83% | 90% | 89% | 87% | 88% |
| හිමිකම් අනුපාතය - දිගුකාලීන | 58 | 57% | 46% | 42% | 51% |
| හිමිකම් අනුපාතය - ජීවිත නොවන | 61% | 63% | 60% | 51% | 61% |
| මුළු හිමිකම් අනුපාතය | 59% | 60% | 53% | 46% | 56% |
| වියදම් අනුපාතය | 86% | 78% | 34% | 84% | 80% |
| ඒකාබද්ධ අනුපාතය | 145% | 138% | 136% | 130% | 136% |

| | | | | | |
|---|---|---|---|---|---|
| ලාභදායිත්ව අනුපාතය | 17% | 20% | 18% | 15% | 17% |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | 3% | 5% | 4% | 3% | 4% |
| හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය | 12% | 16% | 16% | 13% | 13% |
| ආයෝජන ප්‍රතිලාභ අනුපාතය | 10% | 6% | 11% | 8% | 9% |
| ද්‍රවශීලතා අනුපාතය | 1.16 | 1.10 | 1.10 | 1.08 | 1.11 |
| මුළු වත්කම් මත මූල්‍ය වත්කම් අනුපාතය | 86% | 84% | 84% | 84% | 82% |
| තාක්ෂණික සංචිත අනුපාතයට ප්‍රාග්ධනය | 5.03 | 4.23 | 4.06 | 3.71 | 4.14 |
| තාක්ෂණික සංචිත අනුපාතය | 2.02 | 2.05 | 2.07 | 2.01 | 1.98 |
| **වෙළඳපොළ අනුපාත** | | | | | |
| මුළු වෙළඳපොළ කොටස | 15.7% | 16% | 19% | 19% | 17% |
| වෙළඳපොළ කොටස (දීර්ඝකාලීන) | 13.8% | 15% | 18% | 19% | 17% |
| වෙළඳපොළ කොටස (ජීවිත නොවන) | 16.4% | 18% | 21% | 20% | 19% |

| | **කර්මාන්තය** | | | | | **සමාගම** | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **කර්මාන්තය සමඟ සැසඳීම** | **2023** | **2022** | **2021** | **2020** | **2019** | **2023** | **2022** | **2021** | **2020** | **2019** |
| සමස්ත වර්ධන වේගය * | **-1%** | **10.5%** | 12% | 6% | 8% | **9.2%** | **-1%** | 22% | 8% | 10% |
| වර්දන වේගය (දිගුකාලීන)* | **12%** | **9%** | 21% | 16% | 11% | **0.7%** | **-5%** | 14% | 30% | 12% |
| වර්ධන වේගය - ජීවිත රක්ෂණ නොවන)* | **5%** | **13%** | 3% | -1% | 5% | **13.8%** | **-4%** | 5% | 6% | 2% |

*** මූලාශ්‍රය - රක්ෂණ කර්මාන්තය 2023 වර්ෂයේ 4 වැනි කාර්තුව - IRCSL විසින් නිකුත් කරන ලද සංඛ්‍යාලේඛන**

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ. | විගණනය අතරතුර, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ ජීවිත රක්ෂණ අංශය සිය ප්‍රතිරක්ෂණකරු ලෙස "Munich Re" මත පමණක් විශ්වාසය තබා ඇති අතර පවරා ඇති වාරිකය 2023 වර්ෂයේ දී රු.673,867,050 ක් ද, 2022 වර්ෂයේ දී රු. 562,828,854 ක් ද විය. ප්‍රතිරක්ෂණය අවදානම ව්‍යාප්ත කිරීම සඳහා රක්ෂණ ක්ෂේත්‍රයේ සාමාන්‍ය පරිචයක් වන අතර, තනි ප්‍රතිරක්ෂණකරුවෙකු වෙත අවධානය යොමු කිරීම මගින් සමාගමට සංකේන්ද්‍රීය අවදානම සහ ප්‍රති පාර්ශවීය අවදානම වැනි ආවේනික අවදානම් කිහිපයක් මතු කරයි. සංකේන්ද්‍රීය අවදානම ඇති වන්නේ තනි ආයතනයක් මත සමාගම බරපතල ලෙස රඳා පැවතීම මත වන අතර ප්‍රති පාර්ශවීය අවදානම ඇති වන්නේ බංකොලොත්භාවය හෝ මෙහෙයුම් ගැටළුවලදී Munich Re සමාගමට සිය වගකීම ඉටු කිරීමට නොහැකි වීම හේතුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමට සිදුවිය හැකි මූල්‍ය අලාභ හා කීර්තිනාමයට හානි වීම හේතුවෙනි. තවද, ප්‍රතිරක්ෂණ හවුල්කරුවන්ගේ විවිධාංගීකරණයේ ඌනතාවය මගින් යම් සෘණාත්මක සිදුවීම්වල බලපෑම වැඩි කළ හැකිය. | S&P ගෝලීය ශ්‍රේණිගත කිරීම්වලට අනුව, Munich Re 2023 වර්ෂය වන විට වෙළඳපොලේ ඉහළම ප්‍රතිරක්ෂණ සමාගම් 40න් එකකි. කෙසේ වුවද, අපි තවත් ප්‍රතිරක්ෂණකරුවෙකු සොයා ගැනීමේ ක්‍රියාවලියක නිරතව සිටිමු. නව ප්‍රතිරක්ෂණකරුවෙකු හඳුන්වා දෙන්නේ නම්, පැවරූ ප්‍රතිරක්ෂණ වාරිකය වැඩි වීමේ අවදානමක් ඇති විය හැකි බව සැලකිය යුතුය. කෙසේ වුවද, ඒ සමගම, තනි ප්‍රතිරක්ෂණකරුවෙකු සමඟ දැනට පවතින ගිවිසුම හේතුවෙන් සම්පූර්ණත්වය සහ නිරවද්‍යතාවය වැනි අංශවලට බාධාවක් නොවන බවට සහතික වීමට කැමැත්තෙමි. | සංකේන්ද්‍රණය සහ ප්‍රති පාර්ශවීය අවදානම් අවම කිරීම සඳහා ප්‍රතිරක්ෂණ හවුල්කාරිත්වයන් විවිධාංගීකරණය කිරීමට නිර්දේශ කෙරේ. නිරන්තරයෙන්ම පූර්ණ අවදානම් තක්සේරු කිරීම් සිදු කිරීම සහ අවිනිශ්චිත අවස්ථා සැලසුම් සකස් කිරීම. සමාගමේ අවදානම හෙළිදරව් කිරීම නිවැරදිව පිළිබිඹු කිරීම සඳහා ප්‍රතිරක්ෂණ විධිවිධාන සම්බන්ධයෙන් මූල්‍ය වාර්තාකරණයේ විනිවිදභාවය වැඩි දියුණු කිරීම. |
| ආ. | ජීවිත ප්‍රතිරක්ෂණයේ දත්ත ඇතුළත් කිරීම සහ කාර්තුමය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් ජීවගණක කළමනාකරුවෙකු වගකිව යුතු අතර වෙනත් කළමනාකරුවෙකු ඒවා පරීක්ෂා කරයි. කෙසේ වුවද, පහත දක්වා ඇති පරීක්ෂා කරන ලද | ගිණුම් පිළියෙළ කිරීම සඳහා, ජීවිත දෙපාර්තමේන්තුව විසින් සත්‍යාපනය කරන ලද අදාළ තොරතුරු (එනම් දත්ත) තොරතුරු තාක්ෂණ සහ ජීවිත දෙපාර්තමේන්තු මගින් සපයනු ලබයි. | ඉදිරිපත් කිරීමට පෙර ලේඛන සහ ගණනය කිරීම් පිළිබඳ පූර්ණ පරීක්ෂණයක් සිදු කිරීම සහතික කිරීම සඳහා සත්‍යාපන ඒකකයක් කඩිනමින් ස්ථාපනය කිරීමට නිර්දේශ කෙරේ. එසේත් නොමැතිනම්, ප්‍රතිරක්ෂණ |

| | | | |
|---|---|---|---|
| | නියැදියේ පිළියෙළ කරන්නා, සමාලෝචකයා සහ අනුමත කරන පුද්ගලයා සම්බන්ධයෙන් නිසි ලේඛනගත කිරීමක් සිදු කර නොතිබුණි. ලේඛනගත කාර්යභාර නොමැතිකම හේතුවෙන් රාජකාරි කටයුතු වෙන් කිරීම සම්බන්ධයෙන් සැකයක් ඇති වේ.<br>• තනි පුද්ගල ජීවිත ප්‍රතිරක්ෂණය - කාර්තුමය ගිණුම් ප්‍රකාශනය (1 වන කාර්තුව සහ 3 වන කාර්තුව)<br>• සමූහ ජීවිත ප්‍රතිරක්ෂණය - කාර්තුමය ගිණුම් ප්‍රකාශනය (1 වන කාර්තුව සහ 3 වන කාර්තුව)<br>• වෛද්‍ය වියදම් (අමතර සෞඛ්‍ය ආවරණ) කෝටාව බෙදා ගැනීම ප්‍රතිරක්ෂණය - කාර්තුමය ගිණුම් ප්‍රකාශනය (1 වන කාර්තුව සහ 3 වන කාර්තුව) | ගිණුම්වල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය පිළිබඳ විනිශ්චය කිරීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම පමණක් නොව Munich Re මගින් ද සිදු කරයි. මේ වන විට එක් එක් පාර්ශ්වය මගින් කිසිදු විෂමතාවයක් අනාවරණය කරගෙන හෝ හඳුනාගෙන නොමැත. | ක්‍රියාවලියේ අභ්‍යන්තර පාලනයක් ලෙස අභ්‍යන්තර විගණන මැදිහත්වීම ස්ථාපනය කළ යුතුය. |
| ඇ. | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම විසින් සේවයේ නිරත කර ඇති ජීවගණකවරයා විසින් වර්තමාන ප්‍රසාද දීමනා මට්ටමේ තිරසාරභාවය පිළිබඳ ඉහළ මට්ටමේ සමාලෝචනයක් සිදු කර ඇති අතර, ප්‍රසාද දීමනාව පිළිබඳ ප්‍රතිපත්තියක් තිබීම වැදගත්ය. සුදුසු අධිකාරී මට්ටමින් එම ප්‍රතිපත්තියට අත්සන් තබා ඇති අතර ප්‍රසාද දීමනා ප්‍රකාශයට පත් කිරීම ප්‍රතිපත්තියට අනුකූල වන බව කළමනාකාරිත්වය විසින් තහවුරු කර ඇත. | ප්‍රසාද අනුපාත සෑම වසරකම අවසානයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ. කෙසේ වුවද, විධිමත් ප්‍රසාද දීමනා ප්‍රතිපත්තියක් මේ වන විට සකස් කරමින් පවතී. | ප්‍රසාද දීමනා ප්‍රකාශයට පත් කිරීම පාලනය කිරීම, ප්‍රසාද මට්ටම් තීරණය කිරීම සඳහා පැහැදිලි නිර්ණායක සහ ක්‍රියාවලීන් ගෙනහැර දැක්වීම සඳහා පුළුල් ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සමාගම විසින් ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.<br><br>උපායමාර්ගික අරමුණු සහ නියාමන අවශ්‍යතා සමඟ පෙළගැස්වීම සහතික කිරීම මගින් මෙම ප්‍රතිපත්තිය පරිපූර්ණ සමාලෝචනයකට භාජනය වී සමාගම තුළ සුදුසු මට්ටම්වලින් අනුමත කළ යුතුය.<br><br>ප්‍රසාද දීමනා ප්‍රකාශයට පත් කිරීම් ස්ථාපනය කරන ලද ප්‍රතිපත්තිවලට අනුකූලවීම හෝ එවැනි ප්‍රතිපත්ති නොමැති අවස්ථාවලදී, විවිධ රක්ෂණ ඔප්පුහිමියන් සඳහා වත්මන් |

| | | | |
|---|---|---|---|
| | | | ප්‍රසාද දීමනා මට්ටම්වල තිරසාරභාවය සහ යෝග්‍යතාවය සාධාරණීකරණය කිරීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වය විනිවිද පෙනෙන සන්නිවේදනයක් සහ තහවුරු කිරීමක් සැපයිය යුතුය.<br><br>ප්‍රසාද දීමනා ප්‍රකාශන පරිචයන්වල සඵලතාවය සහ සාධාරණත්වය තක්සේරු කිරීමට සහ මතුවන ගැටළු හෝ අදාළ වන කරුණු කල්තියා විසඳා ගැනීමට නිත්‍ය අධීක්ෂණ සහ සමාලෝචන යාන්ත්‍රණ ස්ථාපනය කළ යුතුය.<br><br>ප්‍රතිපත්තියක් නොමැති අවස්ථාවක සහ ප්‍රතිපත්තියට අනුකූල නොවීම තුළ, වත්මන් ප්‍රසාද දීමනා මට්ටම තිරසාර බව සහ විවිධ රක්ෂණ ඔප්පු හිමියන් සඳහා එය සුදුසුය යන නිගමනය සමඟ කළමනාකාරිත්වය එකඟ වන බව තහවුරු කිරීම අවශ්‍ය වේ. |
| **ඇ.** | රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 4.3 වගන්තිය යටතේ, "අවදානම් කමිටුව (RC) අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර අවම වශයෙන් සෑම කාර්තුවකටම වරක් රැස්විය යුතුය." කෙසේ වුවද, 2023 වර්ෂයේ දී අවදානම් කමිටු (RC) රැස්වීම් දෙකක් පමණක් පවත්වා ඇති බව ද, අවදානම් කමිටුව සෑම කාර්තුවකම රැස් වී නොමැති බව ද නිරීක්ෂණය විය. | 2023.03.07, 2023.12.11 සහ 2023.12.21 යන අවස්ථා තුනකදී කමිටුව මගින් රැස්වීම් කැඳවා තිබුණි. | අවදානම් කමිටුව ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවටත්, අවදානම් කළමනාකරණය සඳහා ක්‍රියාකාරී ප්‍රවේශයක් පවත්වා ගෙන යන බවටත්, විය හැකි අවදානම් අවම කර ගනිමින් තම අරමුණු සාක්ෂාත් කර ගැනීමට දායක වන බවටත් සංවිධානය සහතික විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| ඉ. | රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 2.2.2 (ආ) (9) වගන්තියට අනුව, මෙහෙයුම්, පරිපාලන සහ මූල්‍ය ක්‍රියාවලීන් ඇතුළු ප්‍රධාන ක්‍රියාවලීන් සහ ක්‍රියා පටිපාටි නිසි ලෙස ලේඛනගත කර කාලානුරූපව යාවත්කාලීන කිරීම අවශ්‍ය වේ." කෙසේ වුවද, ඉන්වෙන්ටරිය, මානව සම්පත් සහ මුදල් ක්‍රියාවලි සඳහා සමාගම සතුව අත්පොතක් නොමැත. ආයෝජන සඳහා යල් පැන ගිය අත්පොතක් ඇත. | 1. ආයෝජන අත්පොතේ කෙටුම්පතක් පිළියෙළ කර අධ්‍යක්ෂ මණ්ඩලයේ පරීක්ෂාව සඳහා ඉදිරිපත් කර ඇත. එය 2024 දෙසැම්බර් 31 ට පෙර ක්‍රියාත්මක කරනු ඇත.<br>2. රජය සතු ව්‍යවසායක් ලෙස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ ප්‍රසම්පාදන මෙහෙයුම ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ (NPG) මගින් පාලනය වේ. කෙසේ වුවද, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම ක්‍රියාත්මක වන බාහිර පරිසරයේ පවතින තරඟකාරී ස්වභාවය සැලකිල්ලට ගනිමින්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය වැඩි දියුණු කරන 'ප්‍රසම්පාදන ප්‍රතිපත්තියක්' සකස් කර ක්‍රියාත්මක කිරීමට ප්‍රධාන කළමනාකාරීත්වය විසින් අනුමැතිය ලබා දී ඇති අතර භාණ්ඩ, සේවා සහ වැඩ කඩිනමින් ලබා ගෙන ඇත. ප්‍රතිපත්තියේ විෂය පථයට 'ඉන්වෙන්ටරි කළමනාකරණය' ඇතුළත් වේ. ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවේ ප්‍රධානී විසින් ප්‍රසම්පාදන ප්‍රතිපත්ති කෙටුම්පත මෑත කාලයේ දී 'EXCO' වෙත ඉදිරිපත් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය මත එය තවදුරටත් අඛණ්ඩව සිදු කිරීමට නියමිතය.<br>3. මූල්‍ය දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අත්පොත්වල එක් එක් කාර්යය සඳහා මණ්ඩලය විසින් අනුමත කරන ලද මෙහෙයුම් අත්පොත් ඇත. | සමාගමේ මෙහෙයුම්වල කාර්යක්ෂමතාව, අනුකූලතාවය සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා පැහැදිලි මෙහෙයුම්, පරිපාලන සහ මූල්‍ය මාර්ගෝපදේශ ඇතුළත් කරමින් අත්පොතක් පිළියෙළ කිරීමට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය. |
| ඊ. | සමාගමට විධිමත් ලෙස ලේඛනගත ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් (BCP) නොමැත. ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් (BCP) නොමැති වීම මගින් අනපේක්ෂිත සිදුවීම්වලදී සිදුවිය හැකි බාධා සඳහා විසඳුම් | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දෙපාර්තමේන්තුව සතුව දැනටමත් තොරතුරු තාක්ෂණ පද්ධතිය ආශ්‍රිත ආපදා ප්‍රතිසාධන සැලැස්මක්/ව්‍යාපාර අඛණ්ඩතා | බාධාකිරීම්වලදී පවා ව්‍යාපාර මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා උපාය මාර්ග ගෙනහැර දක්වන සහ ප්‍රතිසාධනය සඳහා පැහැදිලි මාර්ගෝපදේශ ඇතුළත් |

| | | | |
|---|---|---|---|
| | සෙවීමට සහ තීරණාත්මක ව්‍යාපාරික මෙහෙයුම් අඛණ්ඩව පවත්වා ගැනීමට සංවිධානයේ සූදානම සම්බන්ධයෙන් සැලකිය යුතු ගැටළුවක් ඇති කරයි. අවදානම් හඳුනා ගැනීම සහ අවම කිරීම, කාර්යභාර සහ වගකීම් නිර්වචනය කිරීම සහ අක්‍රීය කාලය අවම කිරීම සඳහා ක්‍රියා පටිපාටි ස්ථාපනය කිරීම සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් (BCP) අත්‍යවශ්‍ය වේ. | සැලැස්මක් පවතී. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මූලික පද්ධති මත වාර්ෂික ආපදා ප්‍රතිසාධන අභ්‍යාස පවත්වයි.<br><br>කෙසේ වුවද, IT ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම / ආපදා ප්‍රතිසාධන සැලැස්මේ විෂය පථය තොරතුරු තාක්ෂණ මෙහෙයුම් / භූ දර්ශනය සඳහා සීමා වේ. සමස්ත සමාගම සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් සකස් කිරීම සඳහා, ව්‍යවසාය අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර අවශ්‍ය තොරතුරු ව්‍යවසාය මට්ටමේ අවදානම් කළමනාකරණ සැලැස්ම මගින් ලබා ගැනීමට නිර්දේශ කෙරේ. | විස්තීර්ණ ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරේ. ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම මගින් තීරණාත්මක ව්‍යාපාරික ක්‍රියාවලි, කාර්යභාර සහ වගකීම් හඳුනා ගත යුතු අතර, අක්‍රීය කාලය සහ දත්ත නැතිවීම අවම කිරීම සඳහා ක්‍රියා පටිපාටි ස්ථාපනය කළ යුතුය. නැගී එන තර්ජන සහ අනපේක්ෂිත සිදුවීම් සඳහා විසඳුම් ලබා දීම සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම අදාළ වන බව සහ ඵලදායී බව සහතික කිරීම සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම නිතිපතා සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතුය. මෙය සංවිධානයේ ඔරොත්තු දීමේ හැකියාව සහ බාධා කිරීම් හමුවේ අත්‍යවශ්‍ය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව කරගෙන යාමට ඇති හැකියාව වැඩි දියුණු කරනු ඇත. |
| උ. | රක්ෂණ වගකීම් තක්සේරු කිරීම සඳහා භාවිතා කරන ආකෘතියේ කාලානුරූපී සමාලෝචනයක් සඳහා මෙහෙයුම්වල විධිමත් පාලනයක් නොමැත. ආකෘතිවල නිවැරදි බව සහතික කිරීම සඳහා ද, එහි ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන කාලානුරූපී ගණනය කිරීම් සඳහා ද පාලන වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. | ආදර්ශ සමාලෝචනය 2016 සහ 2019 කාලය තුළ පත් කරන ලද ජීවගණක මගින් සිදු කරන ලදී. කෙසේ වුවද, ඉන් පසුව ආකෘතිවල වැඩිදුර වර්ධනයක් සිදු නොවීය. ආකෘති සංශෝධනය කරන සෑම විටම, සමාගම සුදුසුකම් ලත් ජීවගණකවරයකු මගින් අවශ්‍ය සේවා ලබා ගනියි. ප්‍රතිඵලවල ප්‍රමාණාත්මක වෙනස්කම් නොමැති බව සහතික කිරීම සඳහා එක් එක් වසර අවසානයේ දී පත් කරන ලද ජීවගණක විසින් ආකෘති ප්‍රතිදානය තීරණාත්මක ලෙස විශ්ලේෂණය කර ඇත. | ශක්තිමත් වලංගුකරණ ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීම මගින් ආකෘතිවල නිවැරදිභාවය සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන ගණනය කිරීම් සම්බන්ධ පාලන වැඩි දියුණු කිරීම සඳහා සංවිධානය ප්‍රමුඛතාව ලබා දිය යුතුය.<br><br>නිරවද්‍යතාවය සහ ඵලදායිතාව තහවුරු කිරීම සඳහා ආකෘති පිළිබඳ නිරන්තර සමාලෝචන පැවැත්වීම සඳහා විධිමත් ක්‍රියා පටිපාටි ස්ථාපනය කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | | විධිමත් සමාලෝචන කළ නොහැකි අවස්ථාවලදී ආදර්ශ සාවද්‍යතාවයන් හා සම්බන්ධ අවදානම් අවම කිරීම සඳහා හානිපූරණ පාලන සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.<br><br>සියලුම ආදර්ශ වලංගු කිරීමේ ක්‍රියාකාරකම් සහ කළමනාකරණ තහවුරු කිරීම් ලේඛනගත කිරීම මගින් විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම, අභ්‍යන්තර පාලන සහ නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වීම පිළිබඳ පැහැදිලි සාක්ෂි සැපයීම.<br><br>ආදර්ශ සමාලෝචනයක් නොමැති අවස්ථාවල, ප්‍රතිඵලවල නිවැරදි බව සහතික කිරීම සඳහා හානිපූරණ පාලන පවතින බව කළමනාකාරීත්වය මගින් තහවුරු කිරීම අවශ්‍ය වේ. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ. | විගණන සමාලෝචනයේදී, මුද්‍රණ යන්ත්‍ර සඳහා අනුක්‍රමික අංක, අතේ ගෙන යා හැකි දෘඪ තැටි (HD) සහ මධ්‍යම සැකසුම් ඒකකයේ (CPU) අනුක්‍රමික අංක සඳහන් නොකර වත්කම් ලේඛනය 2023 ජූලි 12 වන විට අසම්පූර්ණව පැවති බව නිරීක්ෂණය විය. | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මූල්‍ය වත්කම් කළමනාකරණ කණ්ඩායම සමඟ එක්ව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ තොරතුරු තාක්ෂණ උපාංග පිළිබඳව වාර්ෂික වත්කම් සත්‍යාපනය සිදු කරයි. | සියලුම මුද්‍රණ යන්ත්‍ර, අතේ ගෙන යා හැකි දෘඪ තැටි (HD) සහ මධ්‍යම සැකසුම් ඒකක (CPU) ඒවායේ අනුක්‍රමික අංක ද සමඟ නිවැරදිව සටහන් කර ඇති බව සහතික කිරීම සඳහා වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම නිර්දේශ කෙරේ. අනුක්‍රමික අංක සත්‍යාපනය කිරීමට සහ කිසියම් විෂමතාවක් පැවතියහොත් එය සැසඳීම සඳහා වත්කම්වල භෞතික භාණ්ඩ ලේඛන සත්‍යාපන කටයුතු සිදු කිරීම මෙයට ඇතුළත් විය හැකිය. නව වත්කම් අත්පත් කර ගන්නා විට හෝ වෙනස්කම් සිදු වූ විට, අදාළ සියලු තොරතුරු කඩිනමින් ග්‍රහණය කර ගන්නා බව සහතික |

| | | | |
|---|---|---|---|
| | | | කරමින් වත්කම් ලේඛනය නිතිපතා යාවත්කාලීන කිරීමේ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කළ යුතුය. |
| **ආ.** | සමාගම තක්සේරුකරුවන් තෝරාගැනීම සඳහා අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර ඇතත්, සමාගම තුළ ඉඩම්, ගොඩනැගිලි සහ මෝටර් වාහන තක්සේරු කිරීම් වැනි විවිධ තක්සේරු අංශ සම්බන්ධයෙන් තනි තක්සේරුකරුවෙකුගේ නිරන්තර මැදිහත්වීම නිරීක්ෂණය කළ හැකි විය. තක්සේරු කිරීමේ ක්‍රියාවලිය තුළ විනිවිදභාවය සහ විභව බැඳියා පිළිගැටුම් පිළිබඳව සැකයක් පැවතිය හැකිය. විවිධ වත්කම් පන්ති හරහා එක් තක්සේරු කරන්නෙකුගේ එවැනි සංකේන්ද්‍රිත මැදිහත්වීමක් SLIC හි වත්කම්වල සාධාරණ වෙළඳපල වටිනාකම තීරණය කිරීමේදී ස්වාධීන අධීක්ෂණයක් නොමැති වීමට සහ අපක්ෂපාතී බවක් නොමැති වීමට හේතු විය හැකිය. මෙම තත්ත්වය මගින් තක්සේරු කිරීමේ ක්‍රියාවලියේ අඛණ්ඩතාව සමථයකට පත් කිරීමක් සිදු නොකරනවා පමණක් නොව, ඇතැම් පාර්ශ්වකරුවන්ට පක්ෂග්‍රාහී හෝ අනවශ්‍ය බලපෑම් ඇතිවීමේ අවදානමද ඉහළ නංවයි. | ස්ථාවර වත්කම් තක්සේරුව සඳහා සුදුසුකම් ලත් තක්සේරුකරුවකු තෝරාගැනීමේදී අපි ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනලස්ව අනුගමනය කළෙමු. තවද, ස්ථාවර වත්කම් තක්සේරුවක් සඳහා තක්සේරුකරුවකු තෝරා ගැනීමේදී, තක්සේරුකරුවකුගේ සුදුසුකම් සම්බන්ධයෙන් IRCSL චක්‍රලේඛ 30 ට අනුව කටයුතු කිරීමට සියලුම රක්ෂණ සමාගම්වලට අනිවාර්ය කර ඇති අතර සමාගම මෙම මාර්ගෝපදේශ නිසි ලෙස පිළිපැද ඇත. | ස්වාධීන අධීක්ෂණයක් සිදු කිරීම සහතික කිරීම සහ පක්ෂග්‍රාහිව කටයුතු කිරීමේ අවදානම අවම කිරීම සඳහා සුදුසුකම් ලත් බහුවිධ තක්සේරුකරුවන් අතර තක්සේරු වගකීම් විවිධාංගීකරණය කිරීම නිර්දේශ කෙරේ.<br><br>සුදුසුකම් ලත් තක්සේරුකරුවන්ගෙන් මිල කැඳවීම් මගින් අනෙකුත් සුදුසුකම් ලත් වෘත්තිකයන්ට ලංසු තැබීමේ ක්‍රියාවලියට සහභාගී වීමට හැකි වේ. කාර්යභාර, ප්‍රමිත සහ ගැටුම් කළමනාකරණ ප්‍රොටෝකෝල ගෙනහැර දක්වමින් තක්සේරු ක්‍රියාවලිය පාලනය කරන පැහැදිලි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ස්ථාපනය කළ යුතුය. මීට අමතරව, විගණන හෝ සම්යුරු සමාලෝචන වැනි සමාලෝචන යාන්ත්‍රණයන් ස්ථාපනය කිරීම මගින් ඇගයීමේ ගුණාත්මකභාවය සහ අනුකූලතාව ඇගයීමට ලක් කළ හැකිය. තක්සේරුකරුවන්ගේ සුදුසුකම්, ක්‍රමවේදයන් සහ ඇති විය හැකි බැඳියා පිළිගැටුම් හෙළිදරව් කිරීම තුළින් විනිවිදභාවය වැඩි දියුණු කර පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය වර්ධනය කළ හැකිය. |
| **ඇ.** | ප්‍රතිරක්ෂණ - ජීවිත දෙපාර්තමේන්තුවේ සත්‍යාපන ඒකකයට තෙවන පාර්ශ්වීය බලධාරීන් ඇතුළත් කර නොමැති අතර, ඒවායේ ලේඛන සහ ගණනය කිරීම් අභ්‍යන්තර විගණන අංශය තුළ විගණනය නොකරන බව නිරීක්ෂණය විය. නිසි පරිදි ලේඛන පිරික්සීමේ ඌනතාවය, අනුකූලතාව මගින් දෙපාර්තමේන්තුව තුළ අධීක්ෂණය | සත්‍යාපන ඒකකයක් ස්ථාපනය කිරීමට හෝ අභ්‍යන්තර විගණනය සම්බන්ධ කිරීමට අපි එකඟ වන්නෙමු. | ඉදිරිපත් කිරීමට පෙර ලේඛන සහ ගණනය කිරීම් මනාව පරීක්ෂා කිරීම සහතික කිරීම සඳහා සත්‍යාපන ඒකකයක් කඩිනමින් ස්ථාපනය කිරීමට නිර්දේශ කරනු ලැබේ. එසේත් නොමැති නම්, ප්‍රතිරක්ෂණ ක්‍රියාවලියේ අභ්‍යන්තර පාලනයක් ලෙස අභ්‍යන්තර විගණනය ස්ථාපනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සහ මූල්‍ය වාර්තාකරණයේ නිරවද්‍යතාවය පිළිබඳ ගැටළු ඇති කරයි. | | |
| **ඈ.** | රජය සතු ව්‍යවසාය සඳහා වන මෙහෙයුම් අත්පොතේ මාර්ගෝපදේශවල 5.3 වගන්තිය යටතේ, 2007 අංක 07 දරන සමාගම් පනත මගින් නියම කර ඇති පරිදි, "තුබුන්වත් පරීක්ෂාව සිදු කර ඒ සම්බන්ධයෙන් සෑහීමකට පත් වීමෙන් අනතුරුව, බදු ගෙවීමෙන් පසු ලාභයෙන් අවම වශයෙන් සියයට තිහක් (30) ඒකාබද්ධ අරමුදලට/කොටස් හිමියන්ට බෙදා හැරීමට අපේක්ෂා කෙරේ". කෙසේ වුවද, සමාගම තුළ වර්තමානයේ ලාභාංශ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය. | අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි, ඔවුන්ගේ ප්‍රතිපෝෂණ සඳහා 2019 අප්‍රේල් 25 දින මණ්ඩල පත්‍රිකාව සඳහා මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, ලාභාංශ ප්‍රතිපත්ති කෙටුම්පත මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත. කෙසේ වුවද, අපි ලාභාංශ ප්‍රතිපත්තියේ අන්තර්ගතය නැවත පරීක්ෂා කර, අවශ්‍ය සංශෝධන සිදු කර, වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගන්නෙමු. | කොටස් හිමියන්ගේ වටිනාකම ඉහළ නංවන, ආයෝජකයින්ගේ විශ්වාසයට සහාය වන සහ දිගුකාලීන මූල්‍ය තිරසාරභාවයට දායක වන ලාභාංශ ගෙවීම් සඳහා සමාගම පැහැදිලි සහ ස්ථාවර රාමුවක් ස්ථාපනය කළ යුතුය. |
| **ඉ.** | රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ දක්වා ඇති මාර්ගෝපදේශයේ 6.7 වගන්තිය යටතේ, ස්ථාවර වත්කම් සහ ගබඩා සම්බන්ධයෙන් වාර්ෂික වත්කම් සත්‍යාපනය සිදු කළ යුතුය". කෙසේ වුවද, සමාගම විසින් 2023 වර්ෂය සඳහා වාර්ෂික වත්කම් සත්‍යාපනය සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. | භෞතික වත්කම් සත්‍යාපනය අවසන් කර ඇති අතර දැනට සැසඳීමේ අදියරේ පවතී. වත්කම් සත්‍යාපනයේ අවසාන ප්‍රතිඵලය 2024 අප්‍රේල් මාසයේදී පැවැත්වීමට සැලසුම් කර ඇති මීළඟ විගණන සහ අනුකූලතා කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීමට සැලසුම් කරමින් පවතී. | සමාගම තම වත්කම් වාර්තාවල නිරවද්‍යතාවය සහ අඛණ්ඩතාව සහතික කිරීම, අභ්‍යන්තර පාලන ශක්තිමත් කිරීම ද, වත්කම් අවභාවිතය හෝ මූල්‍ය වාර්තාකරණයේ සාවද්‍යතා සම්බන්ධයෙන් පවතින අවදානම් අවම කළ යුතුය. |
| **ඊ.** | මූල්‍ය ආයෝජන සඳහා සිදු කරන ලද විගණන ක්‍රියා පටිපාටි මත පදනම්ව, කොමර්ෂල් බැංකුව විසින් සනාථ කරන ලද රු. 4,377,848 ක් වටිනා ස්ථාවර තැන්පතු ශේෂය සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | මෙම ආයෝජනයේ මූලික පිළිගැනීම පැවතියේ සුබසාධන අරමුදල තුළය. කෙසේ වුවද, එහි මීළඟ කල්පිරීමේදී, එය SAP භාණ්ඩාගාර මොඩියුලය තුළ වෙනම ආයෝජනයක් ලෙස සටහන් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට අපි අදහස් කරමු. | සමාගමේ මූල්‍ය ප්‍රකාශන සමඟ බැංකු ශේෂ සනාථන සැසඳීමට සහ එහි සම්පූර්ණත්වය සහතික කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු බව නිර්දේශ කෙරේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**විගණන නිරීක්ෂණය**

2023 ජූලි 07 දින සිට සංවිධාන ව්‍යුහය තුළ පුරප්පාඩු වූ තනතුරු කිහිපයක් පවතින බව, විශේෂයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ පුරප්පාඩු වූ තනතුරු පවතින බව නිරීක්ෂණය කර තහවුරු කරන ලදී. විගණන දිනය වන විට ද පුරප්පාඩු වූ තනතුරු බොහොමයක් පුරවා නොමැති අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සාමාන්‍ය | ජීවිත |
|---|---|
| ප්‍රධාන මූල්‍ය නිලධාරී (CFO) | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (DGM) ජීවිත |
| CO - උපාය මාර්ගික ව්‍යාපාර ඒකකය | සහකාර සාමාන්‍යාධිකාරී (AGM) ජීවිත |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරු ප්‍රතිරක්ෂණ | සහකාර සාමාන්‍යාධිකාරී (AGM) ICT |
| සහකාර සාමාන්‍යාධිකාරී (AGM) | ජ්‍යෙෂ්ඨ කළමනාකරු PHS |
| සහකාර සාමාන්‍යාධිකාරී (AGM) හිමිකම් | ජ්‍යෙෂ්ඨ කළමනාකරු ප්‍රතිරක්ෂණ |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරු හිමිකම් | කළමනාකරු (බොරැල්ල ශාඛාව |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරු ගිනි සහ ප්‍රාරක්ෂණ | |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරු පරිපාලන | |

**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**

ජීවිත
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (DGM) ජීවිත - අපේක්ෂකයෙකු තෝරාගෙන ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කෙරේ.

සහකාර සාමාන්‍යාධිකාරී (AGM) ජීවිත - කළමනාකාරිත්වය මගින් එම තනතුර පිරවීමට මෙතෙක් තීරණය කර නොමැත.

සහකාර සාමාන්‍යාධිකාරී (AGM) ICT - කළමනාකාරිත්වය මගින් එම තනතුර පිරවීමට මෙතෙක් තීරණය කර නොමැත.

ජ්‍යෙෂ්ඨ කළමනාකරු PHS - කළමනාකාරිත්වය මගින් එම තනතුර පිරවීමට මෙතෙක් තීරණය කර නොමැත.

ජ්‍යෙෂ්ඨ කළමනාකරු ප්‍රතිරක්ෂණ – කළමනාකාරිත්වය මගින් එම තනතුර පිරවීමට මෙතෙක් තීරණය කර නොමැත.

කළමනාකරු (බොරැල්ල ශාඛාව) - අපේක්ෂකයෙකු තෝරාගෙන ඇති අතර අප්‍රේල් මාසයේදී ආයතනයට සම්බන්ධ වේ.

සාමාන්‍ය
ප්‍රධාන මූල්‍ය නිලධාරී (CFO) - සම්මුඛ පරීක්ෂණය අප්‍රේල් 01 වැනි සතියේ පැවැත්වීමට නියමිතය.

CO - උපාය මාර්ගික ව්‍යාපාර ඒකකය - කළමනාකාරිත්වය මගින් එම තනතුර පිරවීමට මෙතෙක් තීරණය කර නොමැත.

**නිර්දේශය**

බඳවා ගැනීම්, අභ්‍යන්තර උසස්වීම් හෝ වෙනත් සුදුසු උපාය මාර්ග මගින් පුරප්පාඩු වූ ජ්‍යෙෂ්ඨ කළමනාකාර තනතුරු පිරවීම සඳහා ප්‍රමුඛත්වයක් ලබා දිය යුතු බවට සමාගමට නිර්දේශ කෙරේ.

ජ්‍යෙෂ්ඨ කළමනාකරු ප්‍රතිරක්ෂණ - කළමනාකාරිත්වය මගින් එම තනතුර පිරවීමට මෙතෙක් තීරණය කර නොමැත.

සහකාර සාමාන්‍යාධිකාරී (AGM) - කළමනාකාරිත්වය මගින් එම තනතුර පිරවීමට මෙතෙක් තීරණය කර නොමැත.

සහකාර සාමාන්‍යාධිකාරී (AGM) හිමිකම් - කළමනාකාරිත්වය මගින් එම තනතුර පිරවීමට මෙතෙක් තීරණය කර නොමැත.

ජ්‍යෙෂ්ඨ කළමනාකරු හිමිකම් - කළමනාකාරිත්වය මගින් එම තනතුර පිරවීමට මෙතෙක් තීරණය කර නොමැත.

ජ්‍යෙෂ්ඨ කළමනාකරු ගිනි සහ ප්‍රාරක්ෂණ - කළමනාකාරිත්වය මගින් එම තනතුර පිරවීමට මෙතෙක් තීරණය කර නොමැත.

ජ්‍යෙෂ්ඨ කළමනාකරු පරිපාලන - කළමනාකාරිත්වය මගින් එම තනතුර පිරවීමට මෙතෙක් තීරණය කර නොමැත.

## 4. වගකිවයුතුබව සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ. | පසුගිය වසර 8 තුළ අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානීන් බොහෝ දෙනෙකු පත් කර ඇති අතර දීර්ඝ කාලයක් පුරා එහි කිසිවකු නොසිටි බව නිරීක්ෂණය විය. බොහෝ අවස්ථාවල, වැඩබලන අභ්‍යන්තර | ඉහත නිරීක්ෂණයට ප්‍රතිචාර වශයෙන්, අභ්‍යන්තර විගණන ප්‍රධානී තනතුරේ නිතර සිදුවන වෙනස්වීම් පිළිබඳව අපි පූර්ණ වශයෙන් සමාලෝචනය කර ඇත්තෙමු. කෙසේ වුවද, අපගේ සංවිධානයේ සහ එහි ක්‍රියාකාරිත්වයේ සංකීර්ණත්වය සැලකිල්ලට ගෙන, මෙම තීරණාත්මක ස්ථානය පිරවීම | අභ්‍යන්තර විගණකවරයාගේ ස්ථායිතාව සහ සඵලතාවය ඉහළ නැංවීම සඳහා රඳවා ගැනීමේ උපාය මාර්ග, ශක්තිමත් අනුප්‍රාප්තික සැලසුම්, සෞඛ්‍ය සහ යහපැවැත්ම සඳහා සහාය |

| | | | |
|---|---|---|---|
| | විගණකවරයෙකු එම තනතුර දරා ඇත. මේ වන විට, අලුතින් පත් වූ අභ්‍යන්තර විගණකවරයාද වෛද්‍ය නිවාඩු ලබා සිටින අතර වැඩබලන අභ්‍යන්තර විගණකවරයා ලෙස කළමනාකරුවෙකු කටයුතු කරයි. | සඳහා සමාගම තුළ හෝ බාහිර වශයෙන් වඩාත් නිපුණ වෘත්තිකයන් තෝරා ගැනීමට කළමනාකරණය විසින් නිරන්තරයෙන් වෑයම් කර ඇත. ඒ අනුව, මේ වන විට අභ්‍යන්තර විගණන ප්‍රධානී තනතුර පුරවා ඇත. | වීම සහ සම්මත කාර්යසාධන මිණුම් ක්‍රියාත්මක කිරීම නිර්දේශ කරනු ලැබේ. |
| ආ. | අභ්‍යන්තර විගණකාධිපති තනතුරේ නිරන්තරයෙන් සිදු වන වෙනස්වීම් සම්බන්ධ හේතු විනිවිදභාවයකින් තොර වූ හේතු වූ අතර පාලනය සහ පද්ධති පාලන පිළිබඳ කිසිදු සැලකිල්ලක් දක්වා නොතිබුණි. මේ මගින් සමාගමේ කීර්තිනාමයට හානියක් සිදු විය හැකිය. | අභ්‍යන්තර විගණන ප්‍රධානි තනතුරේ නිරන්තරයෙන් සිදුවන වෙනස්වීම් සම්බන්ධ ගැටළු අප විසින් මනාව සමාලෝචනය කර ඇත. මෙම වෙනස්කම් සම්බන්ධ කිසිදු යටි අරමුණක් නොතිබුණු බව අවධාරණය කිරීමට කැමැත්තෙමු. කෙසේ වුවද, අපගේ සංවිධානයේ සහ එහි මෙහෙයුම්වල සංකීර්ණත්වය සැලකිල්ලට ගෙන, මෙම තීරණාත්මක තනතුර පිරවීම සඳහා සමාගම තුළින් හෝ බාහිරව වඩාත්ම තරඟකාරී වෘත්තිකයන් තෝරා ගැනීමට කළමනාකාරිත්වය නිරන්තරයෙන් උත්සාහ දරා ඇත. අපගේ මූලික ඉලක්ක වන්නේ සෑම විටම අපගේ අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම්වල සඵලතාවය සහ අඛණ්ඩතාව සහතික කිරීම වන අතර මේ සම්බන්ධයෙන් ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීමට අපි කැපවී සිටිමු. | අභ්‍යන්තර විගණක ස්ථායිතාව සහ සඵලතාවය ඉහළ නැංවීම සඳහා රඳවා ගැනීමේ උපාය මාර්ග, ශක්තිමත් අනුප්‍රාප්තික සැලසුම්, සෞඛ්‍ය සහ යහපැවැත්ම සඳහා සහාය වීම සහ සම්මත කාර්යසාධන මිණුම් ක්‍රියාත්මක කිරීම නිර්දේශ කිරීම. |
| ඇ. | තොරතුරු තාක්ෂණ පද්ධති විගණනය සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සතුව සුදුසුකම් ලත් පිරිස් නොමැති බවත්, එවැනි සේවා සපයන තෙවන පාර්ශවීය සේවා සපයන්නෙකු නොමැති බවත් නිරීක්ෂණය විය. ආයතනය තුළ තොරතුරු තාක්ෂණ විගණන හැකියාවල පරතරයක් පවතින අතර අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණයේ මෙම තීරණාත්මක අංශය සඳහා විසඳුමක් ලබා ගැනීම සඳහා පුහුණු සම්පත් හෝ බාහිර සහාය අවශ්‍ය බව අවධාරණය කෙරේ. | පද්ධති විගණනය සඳහා සුදුසු අපේක්ෂකයෙකු සොයා ගැනීමට සමාගම ඉමහත් ප්‍රයත්නයක් දරන ලද අතර සමාගම විසින් ගන්නා ලද පියවර පහත දැක්වෙයි.<br><br>i. 2021 මාර්තු 11 දින දැන්වීමක් ප්‍රසිද්ධ කරන ලදී - එක් අපේක්ෂකයෙකු තෝරාගත් අතර ඔහු විසින් පිරිනැමීම ප්‍රතික්ෂේප කරන ලදී.<br>ii. 2022 දෙසැම්බර් 30 වැනි දින නැවතත් දැන්වීමක් ප්‍රසිද්ධ කරන ලදී - මෙම දැන්වීම සඳහා කිසිදු ජීව දත්ත තොරතුරු පත්‍රිකාවක් ලැබී නොතිබුණි.<br>iii. 2023 මාර්තු මස ඉහළ තනතුරු සඳහා සුදුසු පුද්ගලයකු සෙවීම සඳහා පුද්ගලයෙකු සම්බන්ධ කර ගන්නා ලදී - සුදුසුකම් සහිත සාමාජිකයින් නොමැති වූ අතර ඇතැම් | තොරතුරු තාක්ෂණ මෙහෙයුම් පිළිබඳ ශක්තිමත් අධීක්ෂණයක් ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසුකම් ලත් තොරතුරු තාක්ෂණ පිරිස් හෝ තෙවන පාර්ශවීය විගණන සේවා ලබා දීමේ නිරත පිරිස් වෙනුවෙන් ආයෝජනය කළ යුතු බව නිර්දේශ කෙරේ. |

සාමාජිකයින් ඉහළ කළමනාකාර තනතුරු ඉල්ලා සිටින ලදී.

iv. සහකාර කළමනාකරු තනතුර සඳහා දැන්වීමක් 2023 අගෝස්තු 28 දින අභ්‍යන්තරව ප්‍රසිද්ධ කරන ලදී

2023 අප්‍රේල් 24 දින ගත්තා ලද විගණන සහ අනුකූලතා කමිටු (ACC) තීරණයට අනුව, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයින් සහ විගණන සහ අනුකූලතා කමිටුව මගින් පද්ධති විගණනය සඳහා ISACA ශ්‍රී ලංකා ශාඛාවේ සේවා ලබා ගැනීම තවදුරටත් නිර්දේශ කරන ලදී. CIO ද ඒ සඳහා පහසුකම් සලසන ලෙස ඉල්ලා සිටින ලදී.

මීට අමතරව, 2023 අගෝස්තු 28 වන දින පැවති විගණන සහ අනුකූලතා කමිටු රැස්වීමේදී, ඉහත සඳහන් කළ කරුණ පිළිබඳව පැවැත් වූ සාකච්ඡාවලදී සම්මුඛ පරීක්ෂණ කිහිපයක් පවත්වා ඇති බව අනාවරණය වූ අතර, සුදුසු අපේක්ෂකයින් සොයා ගැනීම අභියෝගාත්මක කරුණක් වී තිබුණි. පද්ධති විගණනය හැසිරවිය හැකි කාර්ය මණ්ඩල සාමාජිකයින් නිදහස් කරන ලෙස අංශ ප්‍රධානීන්ගෙන් ඉල්ලා සිටින ලදී.

2023 නොවැම්බර් 21 වන දින පැවැත් වූ විගණන සහ අනුකූලතා කමිටු (ACC) රැස්වීමේදී එම කරුණම නැවත සලකා බලන ලදී. වාර්තාගත කර ඇති රැස්වීම් සටහන් සහ තීරණය පහත පරිදි විය: "සහකාර කළමනාකරු තනතුර අභ්‍යන්තරව ප්‍රසිද්ධ කරන ලද අතර, එම තනතුර සඳහා අයදුම් කරන ලද්දේ එක් ICT විධායකයෙකු පමණි. මෙම අයදුම්පත්‍රය සමාගමේ බඳවා ගැනීමේ පටිපාටියට (SOR) අනුකූල ද යන්න පිළිබඳව කමිටුව විසින් විමසන ලද අතර, අභ්‍යන්තර විගණන ප්‍රධානියාගේ පැමිණීමෙන් පසු සම්මුඛ පරීක්ෂණ ආරම්භ කළ යුතු බව සඳහන් කරන ලදී. කළමනාකාරීත්වය මෙම කරුණේ වැදගත්කම පිළිබඳව පූර්ණ අවබෝධයක් ලබා ඇති අතර, මෙම ගැටලුව කඩිනමින් විසඳීම සඳහා කටයුතු කරමින් පවතී.

**4.2 විගණන කමිටුව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල ඩී.3.1 වගන්තිය යටතේ, “අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් (ඔවුන් අතරින් අවම වශයෙන් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ස්වාධීන අධ්‍යක්ෂවරුන් වන) සමන්විත වන විගණන කමිටුවක් ස්ථාපනය කළ යුතුය. “කෙසේ වුවද, විගණන කමිටුව ස්වාධීන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත නොවන බව නිරීක්ෂණය විය. | භාණ්ඩාගාර ලේකම් විසින් පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන සහ අනුකූලතා කමිටුව (ACC) ස්ථාපනය කරන ලද්දේ මෙම පත්වීම්ලාභීන්ගෙන් වන අතර, ඒ අනුව, විගණන සහ අනුකූලතා කමිටුව (ACC) මෙහෙයුම්, මූල්‍ය සහ නියාමන පළපුරුද්ද සහිත වරලත් ගණකාධිකාරීවරයෙකුගෙන් සමන්විත වේ (ගණකාධිකරණය හා විගණනය සම්බන්ධයෙන් අවශ්‍ය වෘත්තීය සුදුසුකම් සහිත එකම පුද්ගලයා තොටවත්ත මහතාය. ඒ මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු, නීතිවේදියෙකු සහ නිල බලයෙන් භාණ්ඩාගාර නියෝජිත වන අතර වර්තමානයේ මුදල් අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර දරයි). විගණන සහ අනුකූලතා කමිටුව (ACC) ස්ථාපනය කරන අවස්ථාවේදී, විගණන සහ අනුකූලතා කමිටුවේ (ACC) සභාපති ඇතුළු සාමාජිකයින්, මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක ඩී.3.1 හි දක්වා ඇති අවශ්‍යතා තෘප්තිමත් කර තිබුණි.<br><br>කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම යනු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ පරිපාලිත ආයතනයකි. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ පරිපාලිත ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සඳහා පත්කිරීම් ද අදාළ අවස්ථාවන්වලදී, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ නිර්දේශ / නිරීක්ෂණ ද සලකා බලමින් මහා භාණ්ඩාගාර ලේකම් විසින් සිදු කරනු ලබයි. 2022 නොවැම්බර් 16 වැනි දින භාණ්ඩාගාර ලේකම්වරයාගේ අත්සනින් නිකුත් කරන ලද ලිපියක් මගින් එම්.පී. අනිල් කුමාර මහතා වෙනුවට දුෂ්මන්ත තොටවත්ත මහතා කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් පත් කරන ලදී.<br><br>කෙසේ වුවද, විනිවිදභාවය සහ ස්වාධීනත්වය පවත්වා ගැනීම සඳහා, 2024.02.24 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, තොටවත්ත මහතා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ විගණන කමිටුවේ සේවය කරන අතරතුර කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම සම්බන්ධ තීරණ ගැනීමට සහභාගී නොවිය යුතු බව තීරණය කරන ලදී. මෙයට අමතරව, 2024.02.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි, විගණන හා අනුකූලතා කමිටුවේ සභාපතිවරයා ලෙස රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා පත් කර ඇති අතර තොටවත්ත මහතා තවදුරටත් සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. | විගණන කමිටුව සඳහා නියමිත ස්වාධීන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව පත් කළ යුතු බව නිර්දේශ කෙරේ. |